ධර්මදානය පිණිස යි.

බැඳීමෙන් මිදී නිවන කරා යන

# මහාසාරෝපම සූත්‍රය

දේශකයාණෝ


පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ


සැකසුම


පුණ්‍ය ශ්‍රී තුෂන්ත අල්විස්

උපේක්ෂා පියරංගිකා

බැඳීමෙන් මිදී නිවන කරා යන

# මහාසාරෝපම සූත්‍රය

**දේශකයාණෝ**

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

**සැකසුම**

පුණ්‍ය ශ්‍රී තුෂන්ත අල්විස්

උපේක්ෂා පියරංගිකා

ප්‍රථම මුද්‍රණය : වෙසක්/2552 (2008 මැයි)

Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2008

## ශ්‍රී සද්ධර්ම සංසදයෙන් ප්‍රකාශිත වෙනත් ධර්ම ග්‍රන්ථ

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ.

- අසිරිමත් දානය
- සුපිරිසිදු නිවන් මග
- ධම්මචක්කප්පවත්තන සූත්‍රය සහ අමාදම්ඇස පහළ වීම
- ආනාපානසති භාවනාව
- ඉරියාපථ භාවනාව සහ සම්පජඤ්ඤ භාවනාව
- තෙරුවන් වන්දනාව, සෙත් පිරිත් සහ තෙසැත්තෑඤාණ වන්දනාව
- ධම්මානුස්සති භාවනාව
- පටික්කූලමනසිකාර භාවනාව (පිළිකුල් භාවනාව)
- පින සහ කුසලය එකක් ද? දෙකක් ද?
- කර්මය පිළිබඳ අගනා දෙසුමක් (චූළකම්මවිභඞ්ග සූත්‍රය)

පූජ්‍ය දිප්පිටිගොඩ සෝමශාන්ත ස්වාමීන් වහන්සේ.

- ධාතුමනසිකාර භාවනාව
- නවසීවථික භාවනාව
- බුද්ධානුස්සති භාවනාව

බන්දුල ආනන්ද පෙරේරා.

- පරාභව සූත්‍රදේශනාව සහ මහාමඞ්ගල සූත්‍රදේශනාව

නැවත මුද්‍රණය සඳහා, සියලු විමසීම්,

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
රයියාදෙළුව, උග්ගල්බොඩ, ගම්පහ.

**Tel : 071 - 4417813**
**E-mail : info@sadaham.net**
**Web : www.sadaham.net**

## ධර්මදානය සඳහා දායකත්වය

* පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත තරුණ උපාසක මහතා විසින් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන කල්‍යාණමිත්‍රයන් වහන්සේලාට හා හැදූවැඩූ ගුණබර දෙමවුපියන්ට සෙත් පැතීම පිණිස මෙන් ම තමාට වහා නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගැනීම පිණිස,
* පින්වත් **S.** රත්නායක උපාසක මහතා, අමරා උපාසිකා මාතාව, ශ්‍යාමලී උපාසිකා මාතාව, නිරංජලා උපාසිකා මාතාව, ජයමිණි උපාසිකා මාතාව යන පින්වතුන් විසින් තමාට ධර්මාවබෝධය පිණිස,
* පින්වත් උපේක්ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට සෙත් පැතීම පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිස,
* පින්වත් ඩික්සන් ඩයස් උපාසක මහතා විසින් චතුෂ්ක ජනිත් ඩයස් කුමරුට සෙත් පැතීම පිණිස,
* පින්වත් පියසේන තෙන්නකෝන් උපාසක මහතා විසින් තමාට ධර්මාවබෝධය පිණිස,
* පින්වත් තිසේරා උපාසිකා මාතාව විසින් තමාට ධර්මාවබෝධය පිණිස,
* වළකුඹුර, පින්වත් **W. A.** ජයසිංහ උපාසක මහතා විසින් අභාවප්‍රාප්ත දෙමවුපියන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිස,
* පින්වත් පතිරණ උපාසිකා මාතාව විසින් තමාට ධර්මාවබෝධය පිණිස,

මෙම ධර්මදානය සිදු කරන ලදී.

--*--


ප්‍රකාශනය

**ශ්‍රී සද්ධර්ම සංසදය**

**ධම්මාරාම යෝගාශ්‍රමය**

**රයියාදෙළුව, උග්ගල්බොඩ, ගම්පහ.**

**විමසීම්:- 071 - 4417813**

වෙබ් අඩවිය: www.sadaham.net

පිටු සැකසීම හා මුද්‍රණය

e-Artefacts Technologies

**305/5, Hansagiri Road, Gampaha.**

**Tel: 071-4417813, 077-3021777**

**Web: www.eartefacts.com**

<u>**පෙරවදන**</u>

බුදුදහම, ඓහලෞකික මෙන් ම පාරලෞකික උපාය මාර්ගයන් හෙළිදක්වන ලොව විශිෂ්ටත ම දහම යැ'යි පැවසුව එය අවතක්සේරුවක් විය හැකිවා විනා අධිතක්සේරුවක් නම් විය නො හේ ම යැ. එතරමට ම ලොව අන් හැම විජ්ජා ඈ දසුන් ඉක්ම භද්‍ර මණ්ඩනයකින් යුතු ව ප්‍රතිහතතාදි හේතුයෙන් අවිස්පන්දිත වැ හැමකල්හි අකාලික වැ බැබළේ ම ය.

තත්ත්වය මෙසේ වුව ද, පරවාදීන්ගේත් සකවාදීන්ගේත් හිංසනයනට ලක්වීම අතින් නම් සසුනෙහි තත්ත්වය සෝචනීය යැ. දිගු කලෙක පටන් අභිධර්ම-පිටකයට එල්ලකරමින් තිබූ ප්‍රහාර දැන් දැන් වෙනත් මුහුණුවරකින් සූත්‍ර-පිටකයට ද නිර්දය ලෙස ම එල්ලවෙමින් පවතී. විෂ පෙවූ 'කේක්' පෙත්තක බාහිරට පෙනෙන වර්ණ, රසාදි මිහිරියාව හුදු ජීවහරණ විනාශකාරී රැවටීමෙක් වන්නා සේ ම, පිරිසිදු බුදුවදන්හි ගැඹුරු අරුත් මතු කර දීමෙහි ලා පෙර මහකශ්‍යපාදි මහරහතන් වහන්සේලා අතින් රැසැයුණු අට්ඨකථාදි විග්‍රහයන් බැහැර ලමින්, හිතෙන හිතෙන හැටියකින් ධර්මයට වැරදි ලෙස අර්ථ ගෙනහැර පාමින්, ජයට ම කර ගෙන යන මෙ ශාසනික හානිය ථෙර, මහථෙර, සංඝපිතෘ, සංඝනේතෘ, ආදි වගකිව යුතු උතුමනටවත් නො පෙනන හැටි සංවේජනීය යැ.

මෙබඳු පරිසරයක් යටතේ ධර්මාචාර්ය පූජ්‍ය නාවල ධම්මානන්ද හිමිපාණන් සූත්‍රධර්ම, පෙළ - අටුවා - ටීකාදි ප්‍රකාරණාගත නයින් ම විග්‍රහ කර බොදුනුවන් අතට පත්කරලීමට ගෙන යන හුදු ව්‍යාපාරය අතිශයින් ම ප්‍රශංසනීය යැ. මහාසාරෝපම සූත්‍රදේශනය සම්බන්ධ ව රැසැයුණු මෙම ගත ද එහි ප්‍රතිඵලයෙක.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමීය මහසගරුවනේ ඇසුරට පත් ව ශීලාදි ප්‍රතිපත්ති මගෙහි ගමන් කරන පුණ්‍ය ශ්‍රී තුෂන්ත තරුණ මහතාගේ තත්-සමාගමයෙහි සිවුවන වසර සිහිපත් කිරීම පිණිස එම සත්පුරුෂයා විසින් මෙම ග්‍රන්ථය එළිදැක්වීමෙහි ලා පූර්ණ අනුග්‍රහය සලසනු ඇත.

ථෙරවාදි බුදුදහම ලොව බැබළේවා!

**මේ වගට, ශාසනස්ප්‍රීතිකාමී,**

**නුවරඑළියේ ඤාණසීල ස්ථවිර වම්හ.**
**රණගිරිය අරණ්‍ය සේනාසනය,**
**දේවගිරිය, දිද්දෙණිය, මැල්සිරිපුර.**

# හැඳින්වීම

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් වදාරන ලද ඉතා වටිනා සූත්‍රදේශනා රත්නයකි, මජ්ඣිමනිකායේ මූලපණ්ණාසකයට අයත් මහාසාරෝපම සූත්‍රදේශනාව. මහරගම නාවින්නේ ජයතුංග යෝගාශ්‍රමයෙහි දී **2007** වර්ෂයේ කඨින පූජෝත්සවය නිමිත්තෙන් පැවති ධර්මදේශනා මාලාවේ ආරම්භක ධර්මදේශනය වශයෙන් අප විසින් මහාසාරෝපම සූත්‍රය පාදක කර ගෙන සිදු කරන ලද ධර්මදේශනාව ගිහි-පැවිදි සැමට ප්‍රයෝජනවත් දේශනාවකි. **2552** වැනි බුද්ධවර්ෂය සැමරීමේ උතුම් වෙසක් පොහෝ දිනය නිමිති කර ගෙන එම ධර්මදේශනාව කුඩා ග්‍රන්ථයක් වශයෙන් සංග්‍රහ කරන ලද්දේ පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත තරුණ උපාසක මහතාගේ ආරාධනාවෙනි. තුරුණු වියෙහි දී ම තෙරුවන් සරණ ගොස් බුදුසසුනේ උන්නතිය පිණිස විශාල නිහඬ සේවාවක් සිදු කරන පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත මහතාට මෙම ධර්මදානමය කුසලය, උතුම් නිර්වාණධාතුව සාක්ෂාත් කිරීම පිණිස ම හේතු වේවා'යි ආශංසනය කරන අතර මෙම ධර්මදානයෙන් ජනිත කුසල බලය බුදුසසුනේ චිරස්ථිතිය පිණිස හේතු වේවා'යි විශේෂයෙන් ප්‍රාර්ථනා කරමි.

මෙම ධර්මසංග්‍රහය සංස්කරණය කිරීමෙන් අප විසින් ජනිත කර ගත් ධර්මදානමය කුසලය අපගේ පරම පූජනීය උපාධ්‍යායන් වහන්සේ වූ අපවත් වී වදාළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක ශ්‍රී ආර්යවිලාසවංසාලංකාර සද්ධර්මවාගීශ්වරාචාර්ය පටිපත්තිසෝභන ගණපාමොක්ඛාචරිය මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මාහිමිපාණන් වහන්සේට අත්පත් වීමෙන් ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව සැලසේවා!

අපවත් වී වදාළ ප්‍රව්‍රජ්‍යාචාර්ය අතිගරු කිතුලම්පිටියේ ආනන්ද ස්වාමීන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසලය

අත්පත් වීමෙන් ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව සැලසේවා!

අපගේ වත්මන් ගෞරවණීය උපාධ්‍යායන් වහන්සේ වන ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ මහෝපාධ්‍යාය, බුත්තල-බුදුගල්ලෙණ අරණ්‍ය සේනාසනාධිවාසි අතිගරු පූජනීය මාවතගම ගුණානන්දාභිධාන මාහිමිපාණන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසලයේ බලයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා! ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්විඳීමට මෙම කුසලය ද උපනිශ්‍රය වේවා!

මෙබඳු ධර්මග්‍රන්ථ සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ශ්‍රැතමයඥානය දියුණු කර ගැනීම සඳහාත් ගැටමුසු තැන් නිරවුල් කර ගැනීම සඳහාත් මාහට පිහිට වූ ද තමන් වහන්සේගේ ඇසුරට පත්වූවන්ට කාරුණික අවවාදයෙන් මෙන් ම ආදර්ශයෙන් සුමගට යොමු කරන්නා වූ ද ශීල - ශ්‍රැත - ප්‍රඥා - චතුර දේශනා විලාසාදි ප්‍රසාදනීය ගුණස්කන්ධයකින් හෙබියා වූ ද ගිලන් ව සිටිමින් පවා ඉතා ඉවසීමෙන් හා කරුණාවෙන් යුතු ව ධර්මය කියා දෙමින් අපගේ දහම් පවස නිවන්නා වූ ද වත්මන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාධිපති මහාධර්මකථික ත්‍රිපිටකාචාර්ය මහාකම්මට්ඨානාචරිය අතිපූජනීය නා උයනේ අරියධම්මාභිධාන මාහිමිපාණන් වහන්සේට මෙම ධර්මදානමය කුසල බලයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් නිදුකින් වැඩසිටීමට ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා! ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්විඳීමට මෙම කුසලය ද උපනිශ්‍රය වේවා!

විවිධාකාරයෙන් මාහට උපකාර කරන පොල්ගස්ඕවිට, දික්හේන, භාවනා මධ්‍යස්ථානයෙහි අනුශාසක අතිගරු පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේට ද දනවුකන්ද සිරි මංගල යෝගාශ්‍රමාධිවාසි පූජනීය ගලගෙදරගම බෝධිධම්ම ස්වාමීන් වහන්සේට ද පූජනීය ග්‍රීසියේ ඤාණදස්සන ස්වාමීන් වහන්සේට ද දිද්දෙණිය, රණගිරිය අරණ්‍ය සේනාසනාධිවාසි පූජනීය නුවරඑළියේ ඤාණසීල ස්වාමීන් වහන්සේට ද පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි පූජ්‍ය

පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේට ද මහරගම නාවින්නේ ශ්‍රී ජයතුංග යෝගාශ්‍රමාධිපති අතිගරු අම්පිටියේ මඞ්ගල අනුනායක ස්වාමීන් වහන්සේට ද කෘත්‍යාධිකාරි පූජ්‍ය මහරගම පදුම ස්වාමීන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසල බලයෙන් ආයුරාරෝග්‍ය සම්පත් හා නිවන් සුව අත්පත් වේවා!

හැදූවැඩූ මවුපිය දෙදෙනා වහන්සේටත් සිවුපසයෙන් උපස්ථාන කරන දයකකාරකාදි සැමටත් විශේෂයෙන් ම මෙම ග්‍රන්ථයේ පරිගණක මුද්‍රණ කටයුතු සිදු කළ පුණ්‍ය ශ්‍රී තුෂන්ත තරුණ උපාසක මහතාටත් ධර්මදේශනාව පිටපත් කළ උපේක්‍ෂා පියරංගිකා මෙණෙවියටත් මුද්‍රණයට දයක වූ සැමටත් මෙම ධර්මදානමය කුසල කර්මයේ බලයෙන් ධර්මඥාන, භාවනාඥාන වර්ධනය කර ගෙන සුව සේ නිවන් සුව අත්විඳීමට ලැබේවා!

මෙම ධර්මදානමය කුසල කර්මය සදේවකලෝකයාට ද නිර්වාණාවබෝධය පිණිස ම හේතු වාසනා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

**මෙයට,**

**සසුන් ලැදි,**

**පූජ්‍ය නාවල ධම්මානන්ද හිමි.**
**ධම්මාරාම යෝගාශ්‍රමය,**
**උග්ගල්බොඩ,**
**ගම්පහ.**
**(වෙසක් - 2552)**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!
භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!

# මහාසාරෝපම සූත්‍රය
## (ධර්මදේශනය)

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස**

**ඉති බෝ භික්ඛවේ නයිදං බ්‍රහ්මචරියං ලාභසක්කාරසිලෝකානිසංසං න සීලසම්පදානිසංසං න සමාධිසම්පදානිසංසං න ඤාණදස්සනානිසංසං යා ච බෝ අයං භික්ඛවේ අකුප්පා චේතෝවිමුත්ති ඒතදත්ථමිදං භික්ඛවේ, බ්‍රහ්මචරියං ඒතං සාරං ඒතං පරියෝසානන්ති.**

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් තුන්ලෝකය ම සනසාලමින් දේශනා කරන්නට යෙදුණු උතුම් සූත්‍රදේශනා රත්නයක කොටසක් ඒ මාතෘකාව වශයෙන් දේශනා කරන්නට යෙදුණේ. පින්වතුනි, මේ පින්වත් සැමදෙනා ම අද මේ සන්ධ්‍යාභාගයෙහි නාවින්නේ ජයතුංග යෝගාශ්‍රමස්ථ ධර්මශාලාවට එක්රැස් වී සැදී-පැහැදී සූදනම් ව සිටින්නේ මේ වර්ෂයේ වස්සාන පින්කම් මාලාවේ ආරම්භක ධර්මානුශාසනාව ශ්‍රවණය කිරීම සඳහා යි. වස්කාලය පිළිබඳ වත් ඊළඟට වස් අවසානයෙහි සිදු කෙරෙන වස්සාන පින්කම් පිළිබඳ වත් මේ පින්වතුන් හොඳාකාර ව කරුණු ශ්‍රවණය කරලා දැන ගෙන ඉන්නවා ඇති. ඒ නිසා ඒ ගැන වැඩි යමක් සඳහන් කරන්නට උත්සාහ කරන්නේ නහැ.

පින්වතුනි, බුදුරජාණන් වහන්සේ විසින් මේ බුද්ධශාසනයෙහි පරමාර්ථය කුමක් ද’යි කියා පහද දෙමින් වදාළ දේශනා පාඨයක් පළමු ව සඳහන් කරන්නට යෙදුණේ. ඒ දේශනා පාඨය අනුව අපට තේරුම් ගන්න පුළුවනි, සිදු

කෙරෙන මේ සෑම පින්කමක ම අවසාන පරමාර්ථය විය යුත්තේ කුමක් ද? කියන එක. මේ පින්වතුන් නිරන්තරයෙන් ම එදිනෙද දිනපතා දන, ශීල, භාවනා, ධර්මශ්‍රවණ, ධර්මසාකච්ඡා එමෙන් ම බුද්ධෝපස්ථාන, සඞ්ඝෝපස්ථාන මවුපිය-උපස්ථාන, වැඩිහිටි-ගිලානෝපස්ථාන ආදි නොයෙක්විධ පින්කම්වල යෙදෙනවා ඇති. ඒ සෑම පින්කමක ම අවසාන පරමාර්ථය කුමක් දැ'යි කියන එක නිවැරදි ව තෝරා ගෙන ඒ අනුව සිත පිහිටුවා ගෙන තමයි, මේ සෑම පින්කමක ම යෙදිය යුතු වන්නේ.

එවිට ඒ සෑම පින්කමක් ම ඒකාන්තයෙන් මහත්ඵල මහානිසංසදයක වෙනවා. ඒ පින්කම් වෙනුවෙන් පහළ කර ගන්නා සිතිවිල්ලක් සිතිවිල්ලක් පාසා ම මේ පින්වතුන්ට ඉතා උසස් ලෞකික-ලෝකෝත්තර විපාකානිසංස ලබා ගන්නට පුළුවන් වෙනවා. ඒ නිසා අප සෑමදෙනා ම මේ බුද්ධශාසනයේ පරමාර්ථය කුමක් දැ' යි කියා හොඳාකාර ව හඳුනා ගෙන ඒ පරමාර්ථය ඉෂ්ට සිද්ධ වෙන ආකාරයට යි, දන, ශීල, භාවනා, ධර්මශ්‍රවණ ආදි වූ ඒ පින්කම්වල යෙදිය යුතු වන්නේ.

පින්වතුනි, මාතෘකා කරන්නට යෙදුණු ධර්මපාඨය සඳහන් වන්නේ මජ්ඣිමනිකායේ මූලපණ්ණාසකයට අයත් මහාසාරෝපම සූත්‍රදේශනාවෙහි ය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මේ මහාසාරෝපම සූත්‍රාන්තදේශනාව වදරන්නට යෙදුණේ විශේෂ සිද්ධියක් මුල් කර ගෙන යි. ඒ සිද්ධිය තමයි, මේ පින්වතුන් දන්නවා දේවදත්ත තෙරුන් පිළිබඳ ව. බුදුරජාණන් වහන්සේට, සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේට ගිහි-කාලයෙහි සමීපස්ථ ඥාතිවරයෙක්. භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ සම්මාසම්බුද්ධත්වයට පත් වූ පසු ශාක්‍ය කුමාරවරුන් සමග පැමිණිලා මේ දේවදත්ත කුමාරයාත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු හැටියට පැවිදි-උපසම්පදව ලබා ගත්තා.

පැවිදි-උපසම්පදව ලබා ගෙන වැඩි කාලයක් යන්නට පෙර හොඳට සමථ භාවනා ප්‍රගුණ කළා. සමථ භාවනා ප්‍රගුණ කර ගෙන ලෞකික-අභිඥා උපදවා ගත්තා. නමුත් මේ දේවදත්ත තෙරුන් එතැනින් සෑහීමකට පත් වුණා. තමන් උපදවා

ගත්තා වූ ලෞකික-අභිඥා නිසා මෙසේ කල්පනා කළා. එනම් 'දැන් ඉතින් මම කවුරු හරි පහදවා ගෙන බුදුරජාණන් වහන්සේට, ඒ වගේ ම සාරිපුත්ත-මොග්ගල්ලාන ආදි මහරහතන් වහන්සේලාට ලැබෙන ආකාරයේ ලාභ-සත්කාර - සැලකිලි - සම්මාන - ගරුබුහුමන් උපදවා ගන්නට ඕනේ' කියලා, කල්පනා කළා. ඊළඟට විමසා බැලුවා, 'බුදුරජාණන් වහන්සේට, අග්‍රශ්‍රාවක මහරහතන් වහන්සේලාට, අවශේෂ මහාශ්‍රාවකයින් වහන්සේලාට මේ කෝසල රජතුමා, බිම්බිසාර රජතුමා ආදි මහරජවරු නො කඩවා උපස්ථාන කරනවා. මම පහදවා ගන්නේ කවරෙකුව ද?' කියලා එවිට දුටුවා, 'බිම්බිසාර මහරජතුමාගේ පුත්‍රයා අජාතසත්තු කුමාරයා තමයි, මගධ රාජ්‍යයේ ඊළඟට රාජ්‍යයට පත්වෙන්නට ඔටුන්න හිමි කුමාරයා ව සිටින්නේ. එමෙන් ම මේ අජාතසත්තු කුමාරයා වැඩි අත්දැකීම් තිබෙන මේරූ වයසේ ඉන්නා කෙනෙක් නො වේ. තරුණ වයසේ ඉන්නා කෙනෙක්. ඒ නිසා ඉතා පහසුවෙන් ඔහුව පහදවා ගන්නට පුළුවනි. ඒ නිසා මම මේ අජාතසත්තු කුමාරයාව පහදවා ගෙන මටත් ලාභ-සත්කාර - කීර්ති - ප්‍රශංසා ලබා ගන්නට ඕනේ' යනුවෙන් කල්පනා කරලා තමන් තුළ තිබුණු අර ලෞකික අභිඥා බලය පාදක කර ගෙන ඍද්ධිප්‍රාතිහාර්ය දක්වා මේ අජාතසත්තු කුමාරයාව තමා කෙරෙහි පහදවා ගත්තා.

එතැන් පටන් පින්වතුනි, මේ අජාතසත්තු කුමාරයාත් වැඩි සෙවිල්ලක් නැති ව දේවදත්ත තෙරුන් ව තමන්ගේ ගුරුවරයා-ආචාර්යවරයා හැටියට සලකා ගෙන දේවදත්ත තෙරුන්ගෙන් අවවාද උපදේශ ලබා ගෙන දේවදත්ත තෙරුන්ට තමාගේ ගුරුවරයකුට බඳු ව බොහෝ ම සත්කාර සම්මාන කරනවා. කොපමණ සැලකිලි සම්මාන ලැබුණා ද කියනවා නම් එය සඳහන් වන්නේ මෙසේ යි. දේවදත්ත තෙරුන් ඇතුළු දේවදත්ත තෙරුන්ගේ පිරිසට මේ අජාතසත්තු කුමාරයා විසින් දිනපතා බත් සැළි පන්සියයක පමණ මහාදානයක් දුන් බව සඳහන් වෙනවා. ඒ කියන්නේ ඒ තරම් විශාල ප්‍රමාණයක පිරිවරක් ඉඳලා තිබෙනවා, දේවදත්ත තෙරුන්ට.

මේ අජාතසත්තු කුමාරයා බුදුරජාණන් වහන්සේට කළ යුතු

උපස්ථානයක් බඳු ව දේවදත්ත තෙරුන්ට මෙලෙස සැලකිලි සම්මාන කරන්නට පටන් ගත්තා. ඉතින් මේ අයුරින් කල් යන කොට කුමක් ද සිදු වුණේ? මේ දේවදත්ත තෙරුන්ට තමාගේ ඉදිරිය ගැන තිබෙන දැනීම අඩු වුණා. ඉදිරිය ගැන වැඩිය කල්පනා කළේ නැහැ. 'මේ යන ගමන කොතනින් ද කෙළවර වන්නේ?' කියලා දේවදත්ත තෙරුන් කල්පනා කළේ නැහැ. බුදුරජාණන් වහන්සේගෙන් අවවාද උපදෙස් ලබා ගත්තේ නැහැ. එසේ ම සාරිපුත්ත, මොග්ගල්ලාන ආදි ඇසුරු කළ යුතු ගරු කටයුතු සත්පුරුෂ මහරහතන් වහන්සේලාගෙන් අවවාද උපදෙස් ලබා ගත්තේ නැහැ. මේ තරුණ කුමාරයාව පහදවා ගෙන ලාභ-සත්කාර උපදවා ගෙන ඒ අතර ම තමාගේ පිරිසත් වර්ධනය කර ගෙන යනවා.

කල්පනා කර බලන්න, මේ දේවදත්ත තෙරුන් පින්වන්ත තැනැත්තෙක් නේ. ඒ කියන්නේ, පැවිදි වී නොබෝ කලකින් ම හොඳට සමථ භාවනා වඩලා ලෞකික අභිඥා උපදවා ගන්නට තරම් සමත් පුණ්‍යශක්තියක් තිබුණු කෙනෙක්. මේ ලෞකික අභිඥා පවා සාමාන්‍ය කෙනෙකුට ලැබෙන්නේ නැහැ. ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් තිබෙන ඥානසම්ප්‍රයුක්ත කෙනෙකුට තමයි, ඒවා ලැබෙන්නේ.

ධ්‍යාන-මාර්ග-ඵල උපදවා ගන්නට නම්, පින්වතුනි, ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් තිබෙන්නට ඕනෑ ය, කියා ධර්මයෙහි සඳහන් වෙනවා. ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය කියලා කියන්නේ අමුතු දෙයක් නො වෙයි. ඥානසම්ප්‍රයුක්ත කුසලයකින් ලබාපු ප්‍රතිසන්ධියක් තිබෙන්න ඕනෑ ය, කියන එක යි. 'ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් තිබෙන්න ඕනෑ ධර්මය අවබෝධ කර ගන්න, මාර්ග-ඵල අවබෝධ කර ගන්න' කියලා කිවුවහම සමහරු බිය වෙනවා. ඒවා අනවශ්‍ය ලෙස විවේචනය කරනවා. ඒ විවේචනය කරන්නේ කරුණු හරිහැටි සොයා බලා නො වේ.

දැන් බලන්න, අපේ සිද්ධාර්ථ මහබෝසතාණන් වහන්සේ මව්කුස පිළිසිඳ ගන්නා විට ඥානසම්ප්‍රයුක්ත බොහෝ ම බලසම්පන්න කුසලයකින් තමයි, පිළිසිඳ ගත්තේ. ඥානසම්ප්‍රයුක්ත කුසලයක විපාකයක් හැටියට පිළිසිඳ ගත්තොත් තමයි, ඒ ජීවිතය තුළ ඥානය වර්ධනය කරගන්නට පුළුවන්

වෙන්නේ. ඒ නිසා තමයි, මේ ධ්‍යාන-මාර්ග-ඵල ලබන්නට ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් තිබෙන්නට ඕනෑ ය, කියන එක ධර්මයෙහි සඳහන් වෙන්නේ. ඒවා ආවට-ගියාවට සඳහන් වෙන කාරණා නො වේ. ඒවා බොහෝ ම අර්ථවත් ව යි, සඳහන් වෙන්නේ.

දැන් බලන්න, සමහර කෙනෙක් කුසල් කරන කොට ඒ කරන කුසලයෙහි අර්ථය, අනර්ථය හරිහැටි සලකා ගන්නේ නැති ව ඥානසම්ප්‍රයුක්ත ව සිද්ධ නො කර ඥානවිප්‍රයුක්ත ව එය සිද්ධ කරනවා. එවිට ඒ කුසලය එක අංගයකින් අඩු වෙනවා. කුමක්ද? ඥානය යෙදුණේ නැහැ නේ, එතන. බලන්න මේ වැඩිහිටි මවුපියෝ තමන්ගේ කුඩා දූදරුවන් ලවා පින්කම් කරවනවා නේ. සමහර වේලාවට තමන්ගේ නිවසට යාචකයෙක් පැමිණි විට තමන්ගේ කුඩා දුවට නැති නම් පුතාට මුදලක් දීලා කියනවා "පුතේ, මේක අන්න අර දුප්පත් අසරණ තැනැත්තාට දෙන්න" කියලා. නැති නම් කෑම ටිකක් දෙන්න කියනවා. එවිට මේ කුඩා දරුවාට දන් දීමේ ආනිසංස හෝ මේ සියලු සංස්කාර ධර්මයන්ගේ තිබෙන අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ලක්ෂණ හෝ කර්ම, කර්මඵල විපාක ගැන හෝ වැටහීමක් නැහැ. නමුත් මවුපියන් කියන නිසා 'යහපත් දෙයක් ය' යන අදහසින් මේ ක්‍රියාව සිද්ධ කරනවා. ඒ අනුව බලන්න, ඒ දරුවාට ඥානය බලවත් ව යෙදුණේ නැහැ. එබඳු කර්මවලින් ලැබෙන විපාකයක් හැටියට සිද්ධ වෙන ප්‍රතිසන්ධිය ඥානසම්ප්‍රයුක්ත ය'යි කියන්න බැහැ.

ඊළඟට අපි හිතමු, හොඳට සමථ-විදර්ශනා භාවනා වඩලා හොඳ ධර්මඥානයක් තිබෙන, ශ්‍රද්ධාවන්ත, කර්ම-කර්මඵල විශ්වාසයක් තිබෙන, දනානිසංස දන්නා, සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ආදි ත්‍රිලක්ෂණය ගැන වැටහීම තිබෙන, සම්‍යක්දෘෂ්ටියෙන් යුක්ත සත්පුරුෂ පින්වතෙක් යම් කිසි දනයක් දෙනවා. අපි හිතමු, අසරණ කෙනෙකුට යම් කිසි අනුග්‍රහයක් කළා, ආධාරයක් කළා, කියලා. එවිට ඒ ශ්‍රද්ධාවන්ත පින්වතා ශීලයෙහි පිහිටා කර්ම-කර්මඵල විශ්වාසයෙන් යුක්ත ව, දනානිසංස දැන ගෙන සම්‍යක්දෘෂ්ටියෙන් යුක්ත ව සිද්ධ කරන ඒ දනමය කුසලය ඥානසම්ප්‍රයුක්ත කුසලයක්. ඒ ඥානසම්ප්‍රයුක්ත

කුසලයෙහි විපාකයක් හැටියට ලැබෙන ප්‍රතිසන්ධියත් ඉතා අනුභාව සම්පන්න ප්‍රතිසන්ධියක්. එබඳු ප්‍රතිසන්ධියක් ලබන සත්පුරුෂයාට ඒ ජීවිතය තුළ දී තමාගේ ඥානය දියුණු කර ගන්න පුළුවනි, ධ්‍යාන-මාර්ග-ඵල ලැබෙන තත්ත්වය දක්වා ම. ඒ නිසා ත්‍රිහේතුක කුසලයක විපාකය හැටියට ලැබෙන ප්‍රතිසන්ධියක් උරුම කෙනෙකුට තමයි, ධ්‍යාන-මාර්ග-ඵල ලැබෙන බවට ධර්මයෙහි සඳහන් වන්නේ.

එබඳු වාසනාවන්ත උපතක් ලබා ගෙන බොහෝ ඉහළට ඥානය දියුණු කර ගැනීමේ ශක්තියෙන් යුක්ත ව උපන්න කෙනෙක් තමයි, මේ දේවදත්ත තෙරුන්. නමුත් දුර-දිග නො බලා කටයුතු කිරීම නිසා අනතුරේ වැටුණා. ඉතින් දේවදත්ත තෙරුන් ලාභ-සත්කාර උපදවා ගෙන වාසය කරන කොට සමහර භික්ෂූන් වහන්සේලා පැමිණිලා බුදුරජාණන් වහන්සේට මතක් කළා, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, හරි අසිරිමත්. හරි පුදුම සහගත යි. බලන්න මේ අජාතසත්තු කුමාරයා දේවදත්ත තෙරුන් වහන්සේට කොපමණ පැහැදිලා ඉන්නවා ද? උදේ සවස හරියට බුද්ධෝපස්ථානයට බඳු ව උපස්ථාන කරන්න යනවානේ. මහාපෙරහැරකින් තමයි, දේවදත්ත තෙරුන්ව බලන්න යන්නේ. දිනපතා බත් සැළි පන්සියයක විශාල මහාදනයක් දෙනවා, දේවදත්ත තෙරුන් ඇතුළු පිරිසට."

භාග්‍යවතුන් වහන්සේ වදාළා, "මහණෙනි, ඔය දේවදත්ත තෙරුන්ට ලැබෙන ලාභ - සත්කාර -කීර්ති - ප්‍රශංසා ගැන ඊර්ෂ්‍යා කරන්න එපා. දේවදත්ත තෙරුන්ට ඔය ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ලැබීම ඔහුගේ යහපතට හේතු වෙන දෙයක් නො වෙයි. ඒක හරියට මේ කෙහෙල් ගහක කෙහෙල් මුවක් හටගැනීම බඳුයි. (පින්වතුනි, කෙහෙල් ගහක කෙසෙල් මුවක් හටගත්තොත් කුමක් ද වෙන්නේ? කෙහෙල් ගහේ විනාශය ළං වූ විට තමයි, කෙහෙල් ගහේ කෙහෙල් මුවක් හටගන්නේ. කැනක් පීදී කෙහෙල් ගහේ අයුෂ අවසන් වෙනවා.) අන්න ඒ වගේ දෙයක් තමයි, ඔය දේවදත්ත තෙරුන්ටත් සිද්ධ වුණේ" කියලා භාග්‍යවතුන් වහන්සේ බොහෝ ම දුර බලලා එබඳු ප්‍රකාශයක් වදාළා.

තව දුරටත් වදාළා පින්වතුනි, මේ ලාභ - සත්කාර - කීර්ති -

ප්‍රශංසා කියන්නේ ඉතා ම දරුණු දෙයක්; ඉතා ම අනතුරුදායක දෙයක් බව. විශේෂයෙන් ම පැවිදි ශ්‍රාවකයින් වහන්සේලාට තමන් වහන්සේලාගේ ශීල, සමාධි, ප්‍රඥා සම්පූර්ණ කර ගන්නට ඉතා ම අනතුරුදායක දෙයක්. පින්වතුනි, මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලට යට වෙන්නේ පැවිදි ශ්‍රාවකයන් විතරක් නො වෙයි. ගිහි-පැවිදි කවුරු වුණත් නුවණින් නො සලකා කටයුතු කරනවා නම්, ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලට යට වෙනවා. ඒක අද අපට ලෝකය දිහා බලන කොට පෙනෙනවා නේ. ලෝකයේ මේ දියුණුවත් එක්ක තිබෙන තරඟකාරී බව තුළින් මනුෂ්‍යයන් මොනවා ද සොයන්නේ? සොයන්නේ අනෙකක් නො වෙයි, ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා තමයි, සොයන්නේ. දැන් මේ බොහෝදෙනා ඉගෙන ගන්නවා. තරඟකාරී විභාගවලට පෙනී සිටිනවා. ඊළඟට ඒවා ජය අරගෙන මොනවා ද සොයන්නේ? රැකීරක්ෂා, තනතුරු, පදවි ආදිය මේවා නේ ද සොයන්නේ? ඒ අනුව පෙනෙනවා මේ ගිහි-ජනයාත් ලාභ - සත්කාරවලට යට වෙලා තිබෙන හැටි.

ඊළඟට ඇතැම් කෙනෙක් ජනප්‍රිය වෙන්න උත්සාහ කරනවා, නොයෙක් පැතිවලින්. සමහර කෙනෙක් දේශපාලකයන් වශයෙන්, සමහර කෙනෙක් නළුනිළියන් වශයෙන්, සමහර කෙනෙක් ක්‍රීඩකයන් වශයෙන් ජනප්‍රියභාවය සොයනවා. ඒවාත් ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා නේ ද? යාන-වාහන, ඉඩකඩම්, ධනය - දේපල - වස්තුව මේවාත් ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ම නේ ද? බලන්න, දැන් මෙතැන ඉන්න පිරිස ගැන සලකන කොට ධර්මයෙහි හැසිරෙන පිරිස අල්පතර පිරිසක්. ධර්මයෙහි නො හැසිරෙන පිරිස වැඩි ද? අඩු ද? ඒ අය වැඩි යි. ඉතින් ඒ ධර්මයෙහි නො හැසිරෙන පිරිසට, ධර්මයෙහි නො හැසිරෙන්න ප්‍රධාන ම බාධකය වෙලා තිබෙන්නේ මොනවා ද? අර කියන ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ම තමයි.

ඒ කියන්නේ, ශීලයක් රැක ගන්න වේලාවක් නැහැ, බණක් අහන්න වේලාවක් නැහැ, භාවනාවක යෙදෙන්න වේලාවක් නැහැ. කුමක් නිසා ද? රැකීරක්ෂාවල යෙදෙන්න ඕනෙ. ධනය සොයන්න ඕනෙ. යාන-වාහන මිල දී ගන්න ඕනෙ. ඊළඟට

තවත් නොයෙක් රාජකාරි තිබෙනවා. බොහෝදෙනෙකුට දවසේ පැය විසිහතරත් මදි නේ, ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා සඳහා. ඔය යන ගමන අවසන් වෙන්නේ කොතැනින් ද? ඔව්! මරණයෙන් අවසන් වුණායින් පස්සේ ඊළඟට කුමක් ද වෙන්නේ? කර්ම රැස් වුණු පිළිවෙළට, ලාභ-සත්කාරවලින් යටවෙලා කුසලයක නො යෙදී වාසය කළා නම්, අකුසල් නම් ඒ තුළින් සිද්ධ කර ගත්තේ, නිරයේ හෝ තිරිසන්ලෝකයේ හෝ ප්‍රේතලෝකයේ හෝ දුගතියක උත්පත්තියක් ලැබෙන්න පුළුවනි. දුගතියක ම උපතක් සිද්ධ වෙන්න පුළුවනි.

මෙබඳු අන්තරාවක් මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා නිසා කාහටත් වෙන්න ඉඩ තිබෙනවා. මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා සෙවීමේ ආශාවෙන් සිත යට වුණායින් පස්සේ පින්වතුනි, ධාර්මික වත් අධාර්මික වත් දෙයාකාරයෙන් ම මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා සොයා යනවා. වැඩිදෙනෙක් ඒවා සොයන්නේ ධාර්මික ව නො වෙයි, අධාර්මික ව යි. අධාර්මික ව ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා සොයා ගෙන යන කොට කුමක් ද වෙන්නේ? සිතින්, කයින් වචනයෙන් කියන තුන්දෙරින් ම අකුසල් රැස් වෙනවා. ඒ අකුසලයේ විපාක හැටියට නිරය, තිරිසන්ලෝක, ප්‍රේතලෝක ආදි දුගතීන්හි උපත ලබන්නට සිද්ධ වෙනවා.

ඉතින්, මේ අසරණ දේවදත්ත තෙරුන්ටත් සිද්ධ වුණේ අන්න ඒක ම යි. අධාර්මික ව ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා සොයන්න යාමේ විපාකයක් හැටියට සිද්ධ වුණු අකුසල කර්ම නිසා ආනන්තරිය-කර්මත් සිදු කර ගෙන මරණින් පස්සේ බොහෝ දුක් ඇති කටුක විපාක ඇති නිරයේ ගිහින් පහළ වුණා. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බුදුනුවණින් අනාගතය දැකලා'යි භික්ෂූන් වහන්සේලාට කාරුණික ව අවවාද කළේ, "මහණෙනි, මේ දේවදත්ත තෙරුන්ගේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ගැන ඊර්ෂ්‍යා කරන්න එපා! ඔය ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා දේවදත්ත තෙරුන්ට ලැබුණේ ඔහුගේ යහපතට නො වෙයි. අයහපතට"යි කියලා. තව දුරටත් කරුණු පැහැදිලි කළා, මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා සම්බන්ධයෙන්. මේ කරුණු ගැන අපත් හොඳට දැන ගන්නට ඕනෙ. මේවා

අපගේ ජීවිතවලටත් සම්බන්ධ දේ. ගිහි-පැවිදි අප කොයි කාගෙත් ජීවිතවලට ලාභ-සත්කාර ආදිය සම්බන්ධ යි.

භාග්‍යවතුන් වහන්සේ වදාළා "මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලට කෙනෙකුගේ සිතේ තිබෙන ආශාව සිවිය - සම් - මස් - නහර - ඇට විදගෙන ගිහිල්ලා ඇටමිඳුලුවල තැන්පත් වෙලා තිබෙන දෙයක් කියලා. බලන්න, හරි දැඩි ප්‍රකාශයක් නේ! භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රකාශය මේ අයුරින් නැවත වදාළේ මවුපියන්ගේ සිත් තුළ දරුවන්ට තිබෙන ප්‍රේමය ගැන සඳහන් කරන්න යි.

දැන් මෙතන ඉන්න වැඩිහරියක් පින්වතුන් දූදරුවෝ ඉන්න මවුපියෝ නේ. මේ මෑණිවරු, පියවරු දන්නවා තමන්ගේ දූදරුවන්ට කොපමණ ආදරයක්, සෙනෙහසක් තමන්ගේ සිත් තුළ තිබෙනවා ද? කියන එක ගැන. භාග්‍යවතුන් වහන්සේ වදාළා ඒ ස්නේහය තැන්පත් වෙලා තිබෙන්නේ කෙහොම ද? සිවිය - මස් - නහර විදගෙන, ඇටත් විදගෙන ගිහිල්ලා ඇටමිඳුලුවල යි, තැන්පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි සමහර මවුකෙනෙකුට, පියකෙනෙකුට තමන්ගේ එක ම දරුවා නැති වූ විට උමතු බවට පවා පත් වෙන්නට සිද්ධ වෙන්නේ. දැන් බලන්න, පටාචාරාවට තමන්ගේ ස්වාමියත් දරුදෙපළත් මවුපියෝත් මේ සියල්ලන් ම අහිමි වූ විට උමතු බවට පත් වුණා, නේ.

විශේෂයෙන් මවුපියන්ගේ සිත්වල තිබෙන දරුකප්‍රේමය බොහෝ ම අධික යි. එය සිවිය - සම් - මස් - නහර - ඇට විදගෙන ගොස් ඇටමිඳුලුවල තැන්පත් වෙලා තිබෙනවා කියලා කිවුවේ අන්න ඒ නිස යි. භාග්‍යවතුන් වහන්සේ ඒ ප්‍රකාශය ම වදාළා ලාභ-සත්කාර සම්බන්ධයෙන්. වෙනත් කිසි ම දෙයකට භාග්‍යවතුන් වහන්සේ ඔය ප්‍රකාශය වදාළේ නැහැ. දරුකප්‍රේමය ගැන කියන්නත් මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලට සිතේ තිබෙන ආශාව ගැන කියන්නත් තමයි, භාග්‍යවතුන් වහන්සේ ඔය අයුරින් වදාළේ. ඒ දෙක ම සිවිය - සම් - මස් - නහර - ඇට විදගෙන ගිහිල්ලා ඇටමිඳුලුවල තැන්පත් වෙලා තිබෙන දෙයක්.

ඒ අනුව සිතක තිබෙන දරුකප්‍රේමය බඳු දරුණු ආශාවක්

තමයි, කුමක් ද? මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලට සිතේ තිබෙන ආශාව. එය හොඳට මතක තබා ගන්න. දරුවන්ට තිබෙන ආදරය හා සමාන ආශාවක් කාගේත් සිත්වල ලාභ-සත්කාරවලටත් තිබෙනවා. භාග්‍යවතුන් වහන්සේ තව දුරටත් වදාළා පින්වතුනි, තමාගේ මවු නිසා බොරු නො කියන කෙනා මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා නිසා බොරු කියන්න පටන් ගන්නවා. තමාගේ පියා නිසා, දූදරුවන් නිසා, සහෝදර-සහෝදරියන් නිසා බොරු නො කියන කෙනා පවා ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා වෙනුවෙන් බොරු කියන්න පටන් ගන්නවා. බලන්න, එහි දරුණුකම. ඊළඟට 'මහාරත්තරන් ගොඩක් දෙනවා'යි කිවුවත් බොරු නො කියන කෙනා ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා වෙනුවෙන් බොරු කියන්න පටන් ගන්නවා.

ඇත්ත වශයෙන් බලන්න, අද මේ සමාජය මෙපමණට දූෂිත වෙලා තිබෙන්නේ දුශ්චරිතවලින් ගහන වෙලා තිබෙන්නේ කුමක් නිසා ද? මේ කාරණය නිසා ම නේ ද? ඒ අනුව පැහැදිලි යි, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ සර්වඥභාෂිතය කොපමණ සත්‍යයක් ද? කියන එක. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළ බුද්ධවචනයක් කවදාවත් වෙනස් වෙන්නේ නැහැ නේ. ඉතින් ඒ සත්‍යතාව අද අපට ලෝකය දිහා බලන කොට ඉතා ම පැහැදිලි ව පෙනෙන්නට තිබෙනවා. ලෝකයේ වැඩිදෙනෙක් දූෂිත ජීවිත නැති නම් අධාර්මික ජීවිත ගත කරන්නට පෙලඹිලා තිබෙන්නේ ඇයි? මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවන්ගෙන් සිත යට වීම නිස යි. මෙය ධර්මාවබෝධයට අන්තරායක්. ඒ නිසා තමයි, ධර්මය අවබෝධ කර ගන්නට කැමති වන ගිහි-පැවිදි සත්පුරුෂ ශ්‍රාවක-ශ්‍රාවිකා සැමදෙනෙක් ම ඒ අන්තරාය ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුත්තේ. තමතමන්ගේ චිත්තසන්තාන ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් යටවෙන්නට නො දී ආරක්ෂා කර ගන්නට වෑයම් කළ යුතු යි.

පින්වතුනි තමතමන්ගේ සාංසාරික කුසල ශක්තිය අනුව එක්එක්කෙනාට නොයෙක් අයුරින් ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ලැබෙන්න පුළුවනි. එය නවත්තන්න බැහැ. බලන්න,

සීවලී මහරහතන් වහන්සේට තමන් වහන්සේ සිද්ධ කර ගත්තා වූ පුරාකෘත පුණ්‍යධර්මයන්ගේ ආනුභාවයෙන් දෙව්වරු පවා දන් දුන්නා. මනුෂ්‍යයෙකු නැති මහකැලෑ මැද්දෙන්, කාන්තාර මැද්දෙන් භික්ෂු මහාසංඝයාත් සමග පිඬුසිඟා වඩිද්දී, චාරිකාවේ වඩිද්දී දෙව්වරු පවා මහදන් දුන්නා. එයින් පෙනෙන්නේ මහරහතන් වහන්සේලාට පවා ලැබෙන ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා පිළිබඳ ව යි. තමතමන්ගේ පුණ්‍යශක්තිය අනුව කාටත් ලාභ-සත්කාර ලැබෙන්නට පුළුවනි. ඒ වුණත් එයින් සිත යට වෙන්නට නො දී සිත රැක ගන්න අප ධර්මයෙන් ශක්තිමත් වෙන්නට ඕනෙ. එයින් අප පරිස්සම් වෙන්නට ඕනෙ.

භාග්‍යවතුන් වහන්සේ වදාළා, මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් සිත යට වෙන්න නො දී රැක ගන්නට ක්‍රමයක්. කුමක් ද ඒ ක්‍රමය? බලන්න, මේ පින්වතුන් මඳක් කල්පනා කරලා. තමතමන්ගේ චිත්තසන්තාන ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් යට නො වෙන්න නම් කුමක් ද කරන්නට ඕනේ? භාග්‍යවතුන් වහන්සේ වදාළා, අනිත්‍යසංඥාව හොඳට වඩන්න ඕනෙ. අනිත්‍යසංඥාව හොඳට වඩනවා නම් කෙනෙකුගේ සිත මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් යට වෙන්නේ නැහැ**!** බලන්න ඉතා ම වැදගත් උපදේශයක් නේ. ගිහි-පැවිදි අප කොයි කවුරුත් මෙය හොඳින් සලකන්නට ඕනෙ. තමන්ට කොපමණ භෞතික ලාභ ලැබුණත් ඒ සියල්ල ම අපට මරණින් පස්සේ ගෙන යන්න පුළුවන් දේ ද? නැහැ. මේ ජීවිත කාලය තුළ අපට ලැබෙන නොයෙක් ආකාරයේ ප්‍රත්‍යය ලාභ තිබෙනවා. භික්ෂූන් වහන්සේනමකට නම් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස-බෙහෙත් පිරිකර ආදි වශයෙන් ලැබෙන මේ ලාභ සියල්ල ම නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍ය යි.

බලන්න, එවිට තමන්ට කොපමණ ලාභ ලැබුණත් ඒ ලැබෙන ලාභ අනිත්‍ය වශයෙන් සිහි කරන භික්ෂුවට ලාභ-සත්කාර ආදියට තමාගේ සිත යට වෙන්න නො දී පවත්වා ගන්න පුළුවනි. ඊළඟට තමතමන්ගේ පුරාකෘත කුසල ධර්මයන් අනුවත් දන් සිදු කරන්නා වූ සුචරිත ධර්ම අනුවත් නොයෙක් ආකාරයේ කීර්ති, ප්‍රශංසා ආදිය ලැබෙන්න පුළුවනි. ගුණකථන ලැබෙන්න පුළුවනි. එවිට ඒ ගුණකථන සියල්ල අනිත්‍ය

වශයෙන් දකිනවා නම්, ඒ ශ්‍රාවකයාගේ සිත අර කීර්තියෙන් නැති නම් ප්‍රශංසාවෙන් යට වෙන්නට නො දී ආරක්‍ෂා කර ගන්නට පුළුවනි.

මේ අනුව තමන්ට ලැබෙන ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා සියල්ලෙන් ම සිත යට වෙන්නට නො දී ආරක්‍ෂා කර ගන්නට නම් අප සෑම දෙනා ම කුමක් ද කළ යුත්තේ? අනිත්‍යසංඥාව හොඳට වඩන්නට ඕනෙ. ගිහිපින්වතුන් වශයෙන් මේ පින්වතුන්ට රන්, රිදී, මුතු, මැණික් කන්දක් ලැබුණත් සිතන්න 'මේ සියල්ල ම අනිත්‍ය දේ. මේ සියල්ල ම අභාවයට යන දේ. මේ සියල්ල ම සඞ්ඛත යි. මේ සියල්ල ම හේතු-ඵල වශයෙන් හැදුණු දේවල්. මේ කිසිවක නිත්‍ය වූ සැප වූ ආත්මීය සාරයක් නැහැ' කියලා නුවණින් සලකන්න. එහෙම නුවණින් සලකන කොට අර වස්තුවෙහි සිත බැඳෙනවා ද? නෑ. අන්න බලන්න ලාභ-සත්කාරවලින් සිත ආරක්‍ෂා කර ගන්නා පිළිවෙළ.

මේ පින්වතුන්ට අන්‍යයන් ප්‍රශංසා කරනවා නම් ගුණ කියනවා නම් මේ පින්වතුන්ගේ කීර්තිය පැතිරෙනවා. එවිට තමන් කල්පනා කළ යුතු යි, 'කොපමණ හොඳ කිවුවත් කොපමණ ගුණ කිවුවත් කොපමණ කීර්තිය පැතිරී ගියත් නුගුණ කියන අයත් ඉන්නවා නේ. දෙස් කියන අයත් ඉන්නවා නේ. මේ කීර්ති ප්‍රශංසා සියල්ල ම අනිත්‍ය යි, අස්ථිර යි, වෙනස් වෙලා යනවා. මේ සියල්ල ම ක්‍ෂය වෙන දේවල්' කියලා මෙසේ නුවණින් සැලකුවොත් ඒ ශ්‍රාවකයගේ සිත මේ කීර්ති ප්‍රශංසාවලින් යට වෙනවා ද? නැහැ. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ පෙන්වා වදළා, ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් සිත යටවෙන්නට නො දී ආරක්‍ෂා කර ගන්නට නම් කළ යුතු දේ අනිත්‍යසංඥාව හොඳට ප්‍රගුණ කිරීම යි, කියලා.

මේ පින්වතුන් අද පටන් හොඳට අධිෂ්ඨාන තබා ගන්න, 'මාගේ සිත ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ආදියෙන් යට නො වේවා! අද පටන් තබන තබන පියවරක් පියවරක් පාසා බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා වැඩූ ආකාරයෙන් ම අනිත්‍යසංඥාව මාගේ සන්තානයෙහි ප්‍රකට වේවා' කියලා.

දේවදත්ත තෙරුන් මෙබඳු අධිෂ්ඨානයකින් කටයුතු කළේ

නැහැ නේ. ඒ නිසා කුමක් ද සිදු වුණේ? ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් සිත යට වෙලා ගියා. අනිත්‍යසංඥාව අනුව නුවණින් සැලකුවේ නැහැ. ඒ නිසා ම ලාභමදයෙන් සිත මත් වෙලා කල්පනා කළා, තව දුරටත් මේ ලාභලෝභ වැඩි කර ගන්නා ආකාරයක් පිළිබඳ ව. බුදුරජාණන් වහන්සේත් ඔය කාලය වෙන කොට වයෝවෘද්ධ තත්ත්‍වයට පත් වෙමින් සිටියේ. ඒ නිසා දේවදත්ත තෙරුන් කල්පනා කළා 'මේ සංඝයාගේ පාලනය මගේ අතට ගත්තොත් මට මීට වඩා ලාභ-ප්‍රයෝජන සලසා ගන්න පුළුවනි. බුදුරජාණන් වහන්සේට මෙන් මට මනුෂ්‍යයන් හොඳින් සත්කාර කරාවි' කියලා. ඒ අනුව පෙනෙන්නේ දේවදත්ත තෙරුන් බුදුරජාණන් වහන්සේගේ සම්බුද්ධත්වයවත් හරියට හඳුනාගෙන තිබුණේ නැති බව යි.

සම්මාසම්බුද්ධත්වය කියන්නේ පින්වතුනි, ගුරූපදේශ රහිත ව චතුරාර්යසත්‍ය ධර්මය ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ කළ ඉහළ ම උතුමාණන් වහන්සේ පත් වන උත්තරීතර තත්ත්‍වය යි. ඒක කවුරුවත් දෙන තනතුරක් නො වෙයි. බලෙන් ගන්න පුළුවන් තනතුරක් නො වෙයි. නමුත් මේ දේවදත්ත තෙරුන් ඒ ගැන කල්පනා කරන්නේ නැති ව රජුන් සහිත පිරිස රැස්වෙලා ඉන්න වේලාවක බුදුරජාණන් වහන්සේ ඉදිරියට ගිහිල්ලා වැඳලා අවසර ඉල්ලා ගෙන කියා සිටියා "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ වයෝවෘද්ධ යි. දුර්වල යි. දැන් භාග්‍යවතුන් වහන්සේට විවේක සුවයෙන් ඉන්න හොඳ කාලේ. මේ භික්ෂුසංඝයාගේ පාලනය මට ලබා දෙන සේක්වා" කියලා, මෙබඳු නො නිසි ඉල්ලීමක් කළා.

භාග්‍යවතුන් වහන්සේ වදළා "හිස්පුරුෂය, තථාගතයන් වහන්සේ මේ භික්ෂුසංඝයාගේ පාලනය සාරිපුත්ත-මොග්ගල්ලාන මහරහතන් වහන්සේලාටවත් ලබා දෙන්නේ නැහැ. ඔබ වැනි කෙළ බුදින්නෙකුට කොහොම ද තථාගතයන් වහන්සේ මේ භික්ෂුසංඝයාගේ පාලනය ලබා දෙන්නේ?" කියලා. භාග්‍යවතුන් වහන්සේ එයින් ඇඟෙව්වේ මේ දේවදත්ත තෙරුන් ලාභ-සත්කාරවලට යට වෙලා අධාර්මික ව මිථ්‍යාආජීවයෙන් ජීවත් වන අයෙකු බව යි. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය දේවදත්ත තෙරුන්ට සිහිපත් වෙන්න යි, "ඔබ වැනි කෙළ

බුදින්නෙකුට සංඝයාගේ පාලනය ලබා දෙන්නේ නැහැ"යි කියලා වදාළේ.

එතැන දී මේ දේවදත්ත තෙරුන් වෛර බැඳගත්තා බුදුරජාණන් වහන්සේ සමගින්, රජුන් සහිත පිරිසෙහි දී මට භාග්‍යවතුන් වහන්සේ 'කෙළ බුදින්නා' කිවුවනේ කියලා. මෙලෙස වෛර බැඳ ගෙන කල්පනා කළා, හොඳින් නැති නම්, නරකින් හෝ තම අදහස ඉටු කර ගන්නට. දූන් අර වෛරය නේ, හිතේ පැසවන්නනේ. ඒ නිසා දේවදත්ත තෙරුන්ගේ හොඳ පැත්ත අතුරුදහන් වෙලා ගිහිල්ලා නරක පැත්ත මතුවුණා. නරක පැත්ත මතුවෙලා කල්පනා කළා, භාග්‍යවතුන් වහන්සේව ඝාතනය කරන්නට. ඒ සඳහා උපාය සොයන කොට කුමක් ද සිදු වුණේ? තමා විසින් ම බුදුරජාණන් වහන්සේ දෙසට මහාගලක් පෙරළා ඒ ගලෙන් විසි වී ගිය ගල්පතුරක් තථාගතයන් වහන්සේගේ ශ්‍රී පාදයේ වැදිලා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරයේ ලේ සෙලවුණු දවසෙහි දී 'ලෝහිතුප්පාද' කියන මේ ආනන්තරිය අකුසල කර්මය දේවදත්ත තෙරුන් විසින් සිද්ධ කර ගන්නට යෙදුණා.

ඊළඟට එම උත්සාහය අසාර්ථක වූ නිසා සංඝයා බිඳවීමේ උපාය ගැන කල්පනා කළා. 'මේ සංඝයාගේ පාලනය මට ලබා ගන්නට බැරි නම් සංඝයාගෙන් කොටසක් හරි මා වෙන් කර ගන්න ඕනෙ' කියන නරක සිතින්, දුෂ්ට සිතින් කල්පනා කරලා සමගි ව හිටපු සංඝයා බිඳවීමෙන් 'සංඝභේද' ආනන්තරිය කර්මයත් සිද්ධ කර ගත්තා.

ආනන්තරිය කර්ම කියලා කියන්නේ පින්වතුනි, අනතුරු ජීවිතයෙහි දී අනිවාර්යයෙන් ම විපාක දෙන කර්ම කියන අදහස යි. මෙබඳු ආනන්තරිය අකුසල කර්ම පහක් ගැන සඳහන් වෙනවා නේ. ඒ මොනවා ද? තමන්ගේ මනුෂ්‍ය වූ මවු ඝාතනය කිරීම, මනුෂ්‍ය වූ පියා ඝාතනය කිරීම, රහතන් වහන්සේලාව ඝාතනය කිරීම, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරයේ රුධිරය දුෂ්ට සිතින් සෙලවීම සහ සඞ්ඝභේදය. මේවා කරන්න තබා හිතන්නවත් හොඳ නැති අකුසල්. එයින් බොහෝ කාලයකට ධර්මාවබෝධය දුරස්ථ වෙනවා. එයින් වඩාත් ම බලවත් වෙන්නේ 'සංඝභේද' කර්මය යි. එනම් සමගි සංඝයා

බිඳවීම යි. මේ අකුසල කර්මය මේ බුද්ධශාසනයෙහි ප්‍රථමයෙන් සිද්ධ කර ගත්තේ දේවදත්ත තෙරුන් විසින්. ඒ සංඝභේද කර්මය 'කල්පස්ථායී' කර්මයක්. 'කල්පස්ථායී' කියලා කියන්නේ මේ කල්පය අවසන් වෙන තාක් කල් ම කල්ප-විනාශය සිදු වෙන තාක් කල් ම දේවදත්ත තෙරුන්ට නිරයෙන් ගැලවිල්ලක් නැහැ. අන්න ඒක යි, 'කල්පස්ථායී' කියලා කියන්නේ.

මවුපියන් ඝාතනය කිරීම ආදි අකුසල කර්මවල විපාක 'ආනන්තරිය' වුණත් සමහර විට කල්පය ගෙවී අවසන් වෙන්න ඉස්සෙල්ලා නිරයෙන් ච්‍යුත වෙන්න අවස්ථාව ලැබෙන්න පුළුවනි. නමුත් සංඝභේද කර්මයේ විපාක එහෙම නො වෙයි. ඒ කල්පය අවසානය දක්වා ම ඒ කර්මය කරපු තැනැත්තාට නිරයෙහි පැසෙන්නට සිද්ධ වෙනවා. දැන් බලන්න අර ලෞකික අභිඥාවන්ගෙන් අහසින් ගිය දේවදත්ත තෙරුන් මේ මොහොතේ අප මේ ධර්මසාකච්ඡාව සිද්ධ කරන අතර වාරයේ කොහේ ද ඉන්නේ?. නිරයෙ යි, ඉන්නේ. මේ මහාභද්‍ර කල්පය අවසන් වෙන තාක් කල් මහානිරයේ පැසෙන්නට සිද්ධ වෙනවා. බලන්න, සුළු ලාභයක් නිසා සිදු වුණු අනතුර.

බලන්න, කොපමණ කාලයක් ද දේවදත්ත තෙරුන් මෙලොව ජීවත් වුණේ? මෙලොව ජීවත් වුණේ බොහෝ ම සුළු කාලයක්**!** මනුෂ්‍යලෝකයෙහි හිටපු කාලය බැලුවහම ඉතා ම ස්වල්ප කාලයක් නේ. මේ මහාභද්‍ර කල්පය ගෙවෙන්නට කොපමණ තව කල් තිබෙනවා ද? ඉදිරියෙහි දී මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වෙන්නත් ඕනෙ. ඊළඟට තව බුද්ධශූන්‍ය අන්තර්කල්ප බොහෝ ගණනක් ගත වෙන්න ඕනෙ. ඔහොම ගිහින් ගිහින් තමයි, මේ මහාභද්‍ර කල්පය අවසන් වෙන්නේ. එක ජීවිතයක ලැබුණු ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා කොපමණ අල්ප ද? ඒ අල්ප වූ ලාභය සලකන්න ගිහින් කර ගත් වැරදි නිසා මහාඅලාභයක් දේවදත්ත තෙරුන්ට විඳින්න සිද්ධ වෙනවා. බලන්න, මේ ලෝකයට සූර්යයා පෑව්වා වගේ සම්මාසම්බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙලා බුදුරජාණන් වහන්සේගේ දර්ශනය දැක දැක බුදුරජාණන් වහන්සේගේ ඒ සුමිහිරි දහම් දෙසුම් අසමින් ම අනුවණකම නිසා කර ගත් බරපතල අකුසලයක තරම. දැන් එය කවු ද

විඳින්න ඕනෙ? තමන් ම යි. භාග්‍යවතුන් වහන්සේ වදාළේ කොහොම ද? "**යාදිසං වපතේ බීජං තාදිසං හරතේ ඵලං**" යම් අයුරකින් ද තමන් වපුරන්නේ ඒ ආකාරයට තමයි, අස්වැන්න නෙළා ගන්න ලැබෙන්නේ. මෙලෙස ඒ දේවදත්ත තෙරුන් සිද්ධ කර ගත්තා වූ අකුසලයේ විපාක දේවදත්ත තෙරුන්ට ම දැන් නෙළා ගන්නට සිද්ධ වෙලා තිබෙනවා.

පින්වතුනි, කුසලාකුසල සියලු කර්ම තමතමන් වපුරා ගන්නා ආකාරයට තමයි, තමතමන්ට අස්වැන්න නෙළා ගන්නට ලැබෙන්නේ. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වශයෙන් මේ කාරණා අප නිතර සිහිපත් කර ගන්නට ඕනෙ. මොක ද? නැති නම් සුළු වැරදීමක්, අත්වැරැද්දක් නිසා ධර්මාවබෝධයට විශාල අනතුරක් අපටත් සිදු වෙන්න පුළුවනි. ඉතින් ඔය ආකාරයට දේවදත්ත තෙරුන් සංඝභේද කර්මයත් සිද්ධ කර ගෙන රජගහ නුවරින් ඉවත් වෙලා ගියා. රජගහ නුවර ආශ්‍රිත ව හිඳිමින් තමයි, දේවදත්ත තෙරුන් බුදුරජාණන් වහන්සේව ඝාතනය කරන අදහසින් දුනුවායන් යෙදෙව්වේ. එමෙන් ම නාලාගිරි ඇතාව කුපිත කරවලා එව්වෙ. ඊළඟට ගිජ්ජකූට පර්වතයේ දී මහාගලක් පෙරළා එව්වේ. ඔය සියල්ල ම සිදු කරලා සංඝභේදයත් කරලා භික්ෂු පිරිසක් ද රැගෙන රජගහ නුවරින් පිටත් වෙලා ගියා නේ. ඊට පස්සේ සාරිපුත්ත-මොග්ගල්ලාන මහරහතන් වහන්සේලා වැඩම කරලා දේවදත්ත තෙරුන් විසින් කැඳවා ගෙන ගියා වූ අර පන්සියයක් නවක භික්ෂූන් වහන්සේලාව නැවත වැඩම කරවා ගෙන ආවා.

මෙලෙස දේවදත්ත තෙරුන් රජගහ නුවරින් නික්මිලා ගිහින් වැඩි දවසක් යන්න ඉස්සෙල්ලා යි, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් මේ මහාසාරෝපම සූත්‍රදේශනාව වදාරන්නට යෙදුණේ. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කරලා වදාළා, "පින්වත් මහණෙනි, බලන්න, මේ ඇතැම් කුලපුත්‍රයෝ ගිහිජීවිතයෙහි තිබෙන දුක ගැන කල්පනා කරලා 'මේ ගිහිජීවිතය කියලා කියන්නේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන මේ පඤ්චකාමගුණයන් නිසා ඇති වන කම්කටොලු බහුල ගිනි ගොඩක් බඳු තැනක්. එමෙන් ම දූදරුවන්ගේ කරදර මැද නොයෙක් අයුරින් ජීවනෝපායයන්

සිද්ධ කර ගනිමින් ජීවත් විය යුතු කෙලෙස් වැඩෙන්නට ම හේතු වන තැනක් තමයි, මේ ගිහිජීවිතය' (**සම්බාධෝ'යං ඝරාවාසෝ රජෝ පථෝ අබ්භකාසෝ'ව පබ්බජ්ජා** - මේ ගිහිගෙය බොහෝ සම්බාධ-පළිබෝධ සහිත තැනකි. මේ පැවිද්ද අහස බඳු ය) යනුවෙන් සිතා අහස බඳු ඉතා ම නිදහස් විවේකී පැවිදි ජීවිතයට පත් වීමේ ආනිසංස ගැන කල්පනා කරලා පැවිදි වෙනවා.

පැවිදි වෙලා කුමක් ද කරන්නේ? ඒ අය වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා උපදවා ගන්නවා. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මේ අයුරින් වදාළේ කවුරුන් ගැන ද? දේවදත්ත තෙරුන් අරමුණු කර ගෙන. දේවදත්ත තෙරුනුත් ශ්‍රද්ධාවෙන් මහණ වුණු කෙනෙක් නේ. මහණ වෙලා කුමක් ද වුණේ? මේ මහණකමේ පරමාර්ථය ගැන බුද්ධශාසනයේ පරමාර්ථය ගැන කල්පනා නො කර ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලට හසු වුණා නේ. ඒ ගැන යි, භාග්‍යවතුන් වහන්සේ මෙලෙස වදාළේ. එලෙස ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලට යට වුණු කෙනෙක් එයින් සතුටු වෙනවා. එයින් සතුටු වෙලා තමන්ගේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා මුල් කර ගෙන අනෙක් භික්ෂූන් වහන්සේලාව පහත් කරලා හිතනවා.

'මේ අනෙක් භික්ෂූන් වහන්සේලාට නම් මට මෙන් ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ලැබෙන්නේ නැහැ. මට මෙන් මේ දායක පිරිස් සත්කාර-සම්මාන කරන්නේ නැහැ' කියලා තමා උසස් කරලා සලකමින් අන් අයව පහත් කරලා සලකනවා. එතැනින් එහා පැත්තක් ගැන කල්පනා කරන්නේ නැහැ. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළා "ඒ භික්ෂුව මේ බුද්ධශාසනයෙහි අතුකොළ පමණ යි, ගත්තේ. අරටුව සාරය ගත්තේ නැති කෙනෙක්" කියලා. ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා කියන්නේ මේ බුද්ධශාසනයේ අතුකොළ බඳු යි. සාරය නො වෙයි.

ඊළඟට වදාළා එය පැහැදිලි වෙන උදාහරණයක්. එක්තරා මනුෂ්‍යයෙකුට අරටු-ලීයක් අවශ්‍ය වෙලා තිබෙනවා. කුමක් හෝ අවශ්‍යතාවකට යමක් සකස් කර ගන්න ඕනෙ වෙලා අරටු-ලීයක

අවශ්‍යතාවෙන් මේ මනුෂ්‍යයා වෑ පොරෝ ආදි ආයුධත් අරගෙන කැලේට යනවා. කැලේට ගිහිල්ලා හොඳට අරටුව මෝරපු ගහක් දකලා ඒකේ අතුකොළ ටික විතරක් කපා ගන්නවා. කපා ගෙන මිටියක් බැඳ ගෙන මේ මනුෂ්‍යයා එය හිස මත තබා ගෙන යනවා.

මොනවා ද අරගෙන යන්නේ? අතුකොළ! මේ මනුෂ්‍යයාට අවශ්‍ය වුණේ කුමක් ද? අරටුව! දැන් මේ මනුෂ්‍යයා අරටුව හඳුනන කෙනෙක් ද? නැහැ. කවුරු හරි දුටුවොත් ඒ මනුෂ්‍යයාට සිනාසෙනවා නේ ද? "බලන්න මේ මනුෂ්‍යයා අරටුව හඳුනන්නෙත් නැහැ. එළය හඳුනන්නෙත් නැහැ. සිවිය හඳුනන්නෙත් නැහැ. පොත්ත හඳුනන්නෙත් නැහැ. අතුකොළ හඳුනන්නෙත් නැහැ. ඒ නිසා තමයි, අරටුව වශයෙන් සලකා අතුකොළ අරන් ගියේ" කියලා. භාග්‍යවතුන් වහන්සේ වදාළා "යම් කිසි පැවිදි ශ්‍රාවකයන් වහන්සේනමක් මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් ම යට වෙලා එයින් සතුටු වෙලා වාසය කළොත් ඒ තැනැත්තාත් මේ බුද්ධශාසනයෙහි බඹසර සම්බන්ධයෙන් අතුකොළ ටික විතර යි, අරගත්තේ. ඊට වඩා දෙයක් ඒ තැනැත්තාට ලැබෙන්නේ නැහැ"යි කියලා.

මේ කාරණය ගිහි-පැවිදි අප කවුරුත් හොඳට තේරුම් අරගෙන මතක තබා ගන්නට ඕනෙ. අපට අවශ්‍ය වන්නේ කුමක් ද? අතුකොළ ද? අරටුව ද? අවශ්‍ය අරටුව! මේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා කියලා කියන්නේ බුද්ධශාසනයේ බ්‍රහ්මචරියාව සම්බන්ධයෙන් අතුකොළ බඳු දෙයක් ය, ඉතා ලාමක දෙයක් ය, කියලා දැන ගෙන එයින් සිත යට වෙන්නට නො දී සිත රැක ගන්න ඕනෙ. සිත රැක ගන්නේ කෙසේ ද?. අනිත්‍යසංඥාව හොඳට වඩන්න ඕනෙ. අර ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාත් අනිත්‍ය වශයෙන් දැකලා එයින් සිත යට වෙන්නට නො දී සිත රැක ගන්න ඕනෙ.

අනතුරු ව භාග්‍යවතුන් වහන්සේ වදාළා තවත් භික්ෂුවක් සසර කලකිරීමෙන් ගිහිජීවිතය පිළිබඳ ව කලකිරීමෙන් ගිහිගෙයින් නික්මිලා පැවිදි වෙනවා. පැවිදි වෙලා ඒ භික්ෂුවටත් අර කලින් භික්ෂුවට මෙන් ම ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ලැබෙනවා. නමුත් ඒ භික්ෂුව ලාභ - සත්කාර - කීර්ති -

ප්‍රශංසාවලින් සතුටු වෙන්නේ නැහැ. ඒ භික්ෂුව කල්පනා කරනවා, 'ඔය සිවුපසය වෙනුවෙන් නො වෙයි, මා මහණ වුණේ. ඒ නිසා මට ඔය සිවුපසය කියලා කියන්නේ වටිනා දෙයක් නො වෙයි' කියලා ඒ ගැන වැඩි ඇලීමක් ඇති කර ගන්නේ නැහැ. එයින් සතුටු වෙන්නේ නැහැ. ඊළඟට ඒ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා මුල් කර ගෙන තමන් උසස් කරලා අනෙක් අය පහත් කරලා හිතන්නෙත් නැහැ. ඒ භික්ෂූන් වහන්සේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් වදාරා තිබෙන ආකාරයට හොඳට ශීලයෙහි හික්මෙනවා.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා භික්ෂූන් වහන්සේලාට ප්‍රාතිමෝක්ෂසංවර-ශීලය පිළිබඳ ව. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නොයෙක් ආකාරයෙන් ශික්ෂාපද වශයෙන් පනවා වදාළ ශීලය තමයි, මේ ප්‍රාතිමෝක්ෂසංවර-ශීලය කියලා කියන්නේ. ඊළඟට ඉන්ද්‍රියසංවර-ශීලය, ප්‍රත්‍යයසන්නිශ්‍රිත-ශීලය, ආජීවපාරිශුද්ධ-ශීලය වශයෙන් උපසම්පද භික්ෂූන් වහන්සේනමක් විසින් මේ චතුපාරිශුද්ධි ශීලය බොහෝ ම හොඳට ආරක්ෂා කර ගන්න ඕනෙ.

මේ දෙවැනි භික්ෂූන් වහන්සේ හොඳට ශීලය ආරක්ෂා කරනවා. සුළු වරදකටවත් පත් නො වී බොහෝ ම නිර්මල පිරිසිදු ශීල සංවරයකින් යුක්ත වෙනවා. එයින් ම සතුටු වෙනවා. ශීලය ගැන තමයි, ඒ භික්ෂූන් වහන්සේ කල්පනා කරන්නේ. නිතර ශීලයේ අඩුපාඩු හද ගන්නවා. ශීල සංවරයෙන් යුක්ත වෙනවා. එතැනින් එහා දෙයක් ගැන හිතන්නේ නැහැ. ශීලයෙන් සතුටු වෙලා වාසය කරනවා. තමන් වහන්සේගේ සිල්වත් බව ගැන සිතමින් අනෙක් භික්ෂූන් වහන්සේලාව පහත් කරලා සලකනවා. සුළු හෝ වරදක් කරන භික්ෂුවක් දුටුවොත් පහත් කරලා සලකනවා. 'මේ භික්ෂුව නම් දුශ්ශීල කෙනෙක්. මේ භික්ෂුව එක්ක මා කථා කරන්න හොඳ නැහැ. මේ භික්ෂුව ඇසුරු කරන්න හොඳ නැහැ. භජනය කරන්නට හොඳ නැහැ. මේ අය සිල් රකින්නේ නැහැ. මා තරම් සිල්වත් අය නො වෙයි, මේ අය' කියලා අන් අයව පහත් කරලා සලකනවා. ශීලය කරණ කොට ගෙන තමන්ව උසස් කොට සලකනවා. දැන් බලන්න ඒ භික්ෂුව පැමිණි ගමන ශීලයෙන් කෙළවර වුණා නේ ද?

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළා එය හරියට මෙබඳු දෙයක්. කලින් උපමාව ම මෙතැන්ටත් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ආදේශ කළා. භාග්‍යවතුන් වහන්සේ වදාරනවා අරටු-ලීයක් අවශ්‍ය මනුෂ්‍යයෙක් ආයුධ රැගෙන කැලේට යනවා. කැලේට ගිහිල්ලා හොඳට අරටුව තිබෙන ගහක් තෝරා ගෙන ඒ ගහ කපා ගෙන ඒ ගහේ පොතු ටික ගලවා ගන්නවා. පොතු ටික ගලවා ගෙන අර පොතු ටික හොඳට මිටියක් වෙන්න බැඳ ගෙන කර තබා ගෙන යනවා. දැන් මේ කාරණය දකින නුවණැති මනුෂ්‍යයෙකුට කුමක් ද හිතෙන්නේ? මේ මනුෂ්‍යයාගේ නො දැනුවත්කම ගැන හාස්‍යයට ලක්වෙනවා නේ ද? මෙය දකින නුවණැති කෙනෙක් සිතන්න පුළුවනි 'අනේ! මේ මනුෂ්‍යයා අරටුව හඳුනන්නෙත් නැහැ. එලය හඳුනන්නෙත් නැහැ. සිවිය හඳුනන්නෙත් නැහැ. පොතු හඳුනන්නෙත් නැහැ. මෙපමණ වටිනා ගහක් කපා ගෙන පොතු ටික විතරක් රැහැගෙන අරගෙන යනවා නේ ද?' කියලා.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළා, 'යම් භික්ෂුවක් ශීලයෙන් පමණක් සතුටු වෙලා එතැනින් නතර වුණොත් එයත් හරියට බුද්ධශාසනයේ බඹසර සම්බන්ධ පොතු ටික ගත්තා බඳු' යි කියලා. ඊට වඩා සාරයක් ඒ භික්ෂුවට ලැබෙන්නේ නැහැ. මේ ගිහිපින්වතුන් අතර පවා සමහර කෙනෙක් සිටිනවා ශීලය ගැන බොහෝ ම ලැදියි. හොඳට පඤ්ච-ශීලය ආරක්ෂා කරන්න මහන්සි ගන්නවා. නමුත් අන් අයගේ අඩුපාඩුකම් සොයනවා. කවුරුන්ගෙන් හෝ සුළු වරදක් වෙනවා දුටුවොත් 'එයා දුශ්ශීල යි' කියලා එයාව පැත්තකට කරනවා. භජනය කරන්නේ නැහැ. නමුත් තමන්ගේ ශීලය ගැන හිතලා බොහෝ ම මාන්නාධික වෙන්න පුළුවනි. එයින් ම සතුටු වෙලා නවතින්නත් පුළුවනි. ශීලයට වඩා දෙයක් ගැන ඒ තැනැත්තා හිතන්නේ නැහැ. එහෙම සුදුසු නැහැ, පින්වතුනි. ශීලයෙන් පමණක් සතුටු වෙලා ඔහුගේ ගමන නතර වුණොත්, භාග්‍යවතුන් වහන්සේ වදාළා එය හරියට වටිනා අරටු ගහක් කපා ගෙන පොතු ටික විතරක් රැහැගෙන කරපින්නා ගැනීම බඳු'යි කියලා.

භාග්‍යවතුන් වහන්සේ තව දුරටත් කරුණු පැහැදිලි කරමින් වදාළා තවත් භික්ෂූන් වහන්සේනමක් පිළිබඳ ව. ඒ භික්ෂූන්

වහන්සේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් යටවෙන්නෙත් නැහැ. ශීල සංවරයෙන් පමණක් සෑහීමකට පත් වෙලා වාසය කරන්නෙත් නැහැ. ඒ භික්ෂූන් වහන්සේ කල්පනා කරනවා 'මේ ශීලය තිබෙන්නේ සමාධිය සඳහා යි. සමාධියට උපකාරයක් වශයෙන් තමයි, ශීල සංවරය ඇති කර ගන්නේ. මම ප්‍රමාණවත් ව හොඳට ශීලය ආරක්ෂා කරනවා. ඒ නිසා දැන් මා චිත්ත-සමාධිය පිණිස වෑයම් කරන්න ඕනේ' කියලා ඒ භික්ෂූන් වහන්සේ කුමක් ද කරන්නේ? ගුරූපදේශ අනුව නිසි පරිදි භාවනා කර්මස්ථාන දැන ගෙන සමථ භාවනා දියුණු කර ගැනීම සඳහා විවේක තැනකට ගිහිල්ලා භාවනා කරන්නට පටන් ගන්නවා.

පින්වතුනි, භාවනා ක්‍රම හඳුන්වන්න යොදන තවත් පදයක් තම යි, 'කර්මස්ථාන' කියලා කියන්නේ. මේ, 'කර්මස්ථාන' කියලා කියන්නේ 'භාවනා ක්‍රමයක්' - 'භාවනා මාර්ගයක්' කියන අදහස යි. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළ සමථ භාවනා ක්‍රම රාශියක් තිබෙනවා. ඒ සියල්ල එක්තැන් කරලා 'විශුද්ධි-මාර්ගයෙහි' සමසතළිස් කර්මස්ථාන ශීර්ෂයෙන් දක්වා තිබෙනවා. ඒ සියල්ල සමථ භාවනා වශයෙන් උපචාර-අර්පණා සමාධීන් ලැබෙන භාවනා ක්‍රම. සමථ සමාධිය වඩනු කැමති යෝගාවචර භික්ෂූන් වහන්සේනමක් එයින් යම් කිසි භාවනා ක්‍රමයක් හොඳට ඉගෙන ගෙන ගුරූපදේශ සහිත ව ඒ භාවනා ක්‍රමය පුරුදු පුහුණු කරනවා. සමථ වශයෙන් වැඩිය හැකි කවුරුත් වඩන ප්‍රකට භාවනා මාර්ගයක් තමයි, ආනාපානසති භාවනාව. ආනාපානසති භාවනාව පාදක කර ගෙන සමථ-විදර්ශනා දෙක ම වඩන්න පුළුවනි. නමුත් එහි කායානුපස්සනාවට අයත් මුල් කොටස සමථ වශයෙන් තමයි, වැඩෙන්නේ. ඊළඟට දස අසුභ භාවනා, පිළිකුල් භාවනාව, කසිණ භාවනා ආදි මේ සියල්ල ම සමථ වශයෙන් වැඩෙන භාවනා. සමථ භාවනා ක්‍රම හතළිහක් ගැන සඳහන් වෙනවා. දස-කසිණ, දස-අනුස්සති, දස-අසුභ. එතැන තිහක් තිබෙනවා. ඊළඟට බ්‍රහ්මවිහාර හතර යි, අරූප භාවනා හතර යි, ආහාරයේ පටික්කූලසංඥාව යි, ධාතුමනසිකාරය යි කියන මේ දහයත් එක්ක සියල්ල හතළිහක් වෙනවා.

එයින් යම් කිසි කර්මස්ථානයක් ඉගෙන ගෙන දැන් මේ යෝගාවචර භික්ෂුව විවේක තැනක් - කඳු මුඳුනක් නැති නම් ගල්ගුහාවක්, විවේක ආරණ්‍ය සේනාසනයක් බඳු-සුදුසු තැනක් තෝරා ගෙන හොඳට සමථ භාවනාව වඩනවා. මෙසේ කාලයක් ප්‍රගුණ කරන කොට මේ යෝගාවචර ස්වාමීන් වහන්සේට උපචාර සමාධි - අර්පණා සමාධි දියුණු කර ගන්නට ලැබෙනවා. ඉන් පසු ඒ ස්වාමීන් වහන්සේ කල්පනා කරනවා, දැන් තමන් වහන්සේට හොඳ සමාධියත් තිබෙනවා නේ. සමහර වේලාවට ධ්‍යාන සමාධියක් වෙන්නට පුළුවනි. ප්‍රථමධ්‍යානය, දෙවෙනිධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය ආදී වශයෙන්. ඒ ස්වාමීන් වහන්සේට පෙනෙනවා අනෙක් භික්ෂූන් වහන්සේලා භාවනාවට වැඩිය උනන්දු වෙන අය නො වේ. ඒ අය නොයෙක් අයුරින් වැඩකටයුතුවල යෙදී ඉන්නවා. සමහර කෙනෙක් ඉගෙන ගන්නවා. සමහර කෙනෙක් උගන්වනවා. සමහර කෙනෙක් ධර්මදේශනා කරනවා. සමහර කෙනෙක් පොත්පත් ලියනවා. සමථ භාවනා වඩන ඒ භික්ෂුව කල්පනා කරනවා, 'මට නම් හොඳට සමාධිය තිබෙනවා. අනෙක් අයට නම් සමාධියක් නැහැ. අනෙක් භික්ෂූන් වහන්සේලා උපචාර සමාධියවත් නැති වික්ෂිප්ත-භ්‍රාන්ත සිත් ඇති අය' යි කියලා අනිත් අයව පහත් කරලා තමාව උසස් කොට සලකනවා. ඒ සමාධි භාවනාවෙන් ම සෑහීමකට පත් වෙනවා. එතැනින් එහා දෙයක් හිතන්නේ නැහැ.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අරටුවේ උපමාව මෙතැන්ටත් ආදේශ කරලා වදාළා. අරටු-ලීයක් අවශ්‍ය මනුෂ්‍යයෙක් ආයුධයක් රැගෙන කැලේට යනවා. කැලේට ගිහිල්ලා හොඳට අරටුව තිබෙන ගහක් කපලා ඒ ගහේ අතු-කොළත් කපා දාලා, පොතුත් රැහැලා දාලා, සිවිය කොටස විතරක් වෙන් කර ගන්නවා. සිවිය කොටස වෙන් කර ගෙන ඒ ටික පොදි බැඳ ගෙන කරපින්නා ගෙන යනවා. භාග්‍යවතුන් වහන්සේ වදාළා, ඒ වගේ තමයි, යම් කිසි භික්ෂුවක් සමාධි භාවනාවෙන් ම සෑහීමකට පත් වුණොත් එතැනින් එහා දෙයක් ගැන නො සිතුවොත් එයින් ම තමාව උසස් කරලා අනුන්ව පහත් කරලා සලකන්න පටන් ගත්තොත් ඒ භික්ෂුව ලබා ගෙන

තිබෙන්නේ මේ බුදුසසුනේ-බඹසරේ සිව්ය පමණ යි. එතනින් එහා දෙයක් ඒ භික්ෂුවට ලැබෙන්නේ නැහැ'යි කියලා. ඒ නිසා අපි අධිෂ්ඨාන තබා ගන්නට ඕනේ, අපේ ගමන එතැනින් නතර නො වීම සඳහා. ඒ කියන්නේ ශීලයෙන් සෑහීමකට පත් වෙලා එතනින් නතර වෙන්න නරක යි. එමෙන් ම සමාධි භාවනා වඩලා එයිනුත් සෑහීමකට පත් වෙන්න නරක යි. ඊළඟට යම් කිසි කෙනෙක් භාවනා නො කරනවා නම් පින්වතුනි, ඒ අයව පහත් කරලා සලකන්නත් සුදුසු නැහැ. තමා යම් කිසි අයුරකින් භාවනාවකට යොමු වෙලා ඉන්නවා නම්, එය තමාගේ ලාභයක් බව සත්‍යයක්. නමුත් අනිත් කෙනෙක්ව පහත් කරලා හිතන්න හොඳ නැහැ. 'ඒ අය භාවනා කරන්නේ නැති අය. ඒ අයට සමාධියක් නැහැ' කියලා පහත් කරලා හිතන්න නරකයි. සමහර වේලාවට යම් කිසි අවස්ථාවක දී තමා පරදින්න පුළුවනි. අර බැරිකෙනා දිනන්න පුළුවනි. මේ පින්වතුන් අහලා තිබෙනවා, ළදරු-පාසල් යන කාලේ, අර ඉබ්බාගේත් හාවගේත් කථාව. නේ ද? එබඳු දේවල් සිද්ධ වෙන අවස්ථා තිබෙනවා. සමහර විට කලින් භාවනා කරන්න පටන් ගත් කෙනා පහුවෙලා පස්සේ පටන් ගත් කෙනා දිනන අවස්ථා තිබෙනවා.

මේ පින්වතුන් අහලා තිබෙනවා නේ, අර සන්තති ඇමතිතුමා ගැන. සන්තති අමාත්‍යයා අර්හත්වයට පත් වුණු දවසෙහි එතුමා උදෑසන හොඳට මත්පැන් පානය කරලා, හිටියේ. උදෑසන ම රාජාභරණ පැළඳ ගෙන ඇතා පිටින් උයනට යන ගමන් බුදුරජාණන් වහන්සේව දකලා භාග්‍යවතුන් වහන්සේට හිස නමා ආචාර කරලා ගියා. එදා ම එතුමාට ජීවිතයේ හරි කලකිරීමක් ඇති වෙන සිද්ධියක් සිදු වුණා. එතුමා බොහෝ ම ප්‍රිය කළ නළඟනක් දවස් හතක් ම (ඒ නළඟන) නටලා වෙහෙස වැඩිකමට හෘදයාබාධයක් හැදිලා මේ සන්තති අමාත්‍යයා බලා සිටිය දී ම මරණයට පත් වුණා. මෙයින් කම්පිත වුණු මේ ඇමතිතුමා බුදුරජාණන් වහන්සේව සොයා ගෙන ගියා. භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ සතරපද ගාථාවක් ශ්‍රවණය කරලා මේ සන්තති අමාත්‍යයා ගිහිඇඳුම් පිටින් ම ගිහිස්වරූපයෙන් සිටිය දී ම ගිහිබන්ධන ප්‍රහාණය කරමින් උතුම් වූ අර්හත් ඵලයටත් පත් වුණා.

බලන්න, ඊට ඉස්සෙල්ලා භාවනා කරන්න පටන් ගත් කොපමණ දෙනෙක් ඒ වන විට ඉන්නට ඇති ද? සන්තති අමාත්‍යයා එද උදෙත් මත්පැන් පානය කරලා යි, හිටියේ. නමුත් නියම වේලාව පැමිණි විට සසර පුණ්‍යශක්තිය තිබෙන ප්‍රඥවන්ත තැනැත්තා ජය ගන්නවා. අන්න ඒ නිසා භාවනා නො කරන අය සම්බන්ධයෙන් ඒ අයව පහත් කරලා සලකන්න නරක යි. සමහර වේලාවට, නිසි කාලයෙහි ඒ අය භාවනාවට යොමු වූ විට අප පරදින්න පුළුවන්. ඒ අය දිනන්න පුළුවන්.

ඊළඟට භාග්‍යවතුන් වහන්සේ වදළා, තවත් භික්ෂූන් වහන්සේනමක් පිළිබඳ ව. ඒ භික්ෂූන් වහන්සේ ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් යට වෙන්නෙත් නැහැ. ශීල සංවරයෙන් ම පමණක් සෑහීමකට පත් වෙන්නෙත් නැහැ. සමාධිසම්පදාවෙන් පමණක් සෑහීමකට පත් වෙන්නෙත් නැහැ. ඒ භික්ෂූන් වහන්සේ ලෞකික-අභිඥා පාදක කර ගෙන දිවැස්නුවණ ඇති කර ගන්නවා. මේ ලෞකික-අභිඥා ගැන සලකන කොට දිවැස්නුවණ ප්‍රධාන යි. ඒ දිවැස්නුවණ ඇති කර ගන්නවා. ඒ භික්ෂූන් වහන්සේට අර දේවදත්ත තෙරුන්ට මුල් කාලයේ දී වගේ හොඳට දිවැසින් බලන්න පුළුවනි. ඉතින් ඒ භික්ෂූන් වහන්සේ එම දිබ්බචක්ඛුඤාණය සම්බන්ධයෙන් (ඥානදර්ශනය කියල යි, ඒ දිබ්බචක්ඛුඤාණය මෙතැන දී හඳුන්වන්නේ.) සෑහීමකට පත් වෙනවා. එයින් සෑහීමකට පත් වෙලා තමන්ව ඒ ගුණයෙන් උසස් කරලා සලකනවා. දිබ්බචක්ඛුඤාණය නැති අයව පහත් කරලා සලනකනවා. ඒ භික්ෂුව හිතනවා 'මේ අනිත් අයට ප්‍රේතයෙක්, පිසාචයෙක් තරම්වත් පේන්නේ නැහැ. මට දෙව්ලොව පේනවා. බඹලොව පේනවා. අතීත ආත්මභාව පේනවා. අනාගත ආත්මභාව පේනවා. මේ අනිත් භික්ෂූන් වහන්සේලා නිකම් හිස් අය. මට නම් දිබ්බචක්ඛුඤාණය තිබෙනවා' කියලා. එයින් ම ඒ භික්ෂුව සතුටට පත් වෙනවා. එයින් ම සෑහීමකට පත් වෙනවා. ඊට වඩා වැඩි දෙයක් ගැන හිතන්නේ නැහැ.

භාග්‍යවතුන් වහන්සේ වදාළා එය හරියට අරටු-ලීයක් අවශ්‍ය මනුෂ්‍යයෙක් කැලේට ගිහින් හොඳ වටිනා අරටුව තිබෙන ගහක් කපා ගෙන එහි අතුකොළත් අත්හැරලා පොතුත්

සිවියත් අත්හැරලා එළය කපා ගන්නවා. තව ටික යි, අරටුවට තිබෙන්නේ. හැබැයි, අරටුව හඳුනා ගත්තේ නැහැ. එළය කපා ගෙන එළය කොටස කරපින්නා ගෙන යනවා. ඉතින් මෙය දකින නුවණැති කෙනෙකුට හිතෙන්නේ කුමක් ද? 'මේ මනුස්සයා වටිනා ගහක් කපා ගෙන අතුකොළ, සිවිය සියල්ල ම පැත්තකට දලා එළය කපා ගත්තා. තව ටික යි, මහන්සි වුණා නම්, අරටුවත් කපා ගන්න තිබුණා නෙව ද?' කියලා දකිනවා.

භාග්‍යවතුන් වහන්සේ වදාළා, යම්කිසි භික්ෂුවක් ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ආදියත් අත්හැරලා ශීල සංවරයෙනුත් සෑහීමකට පත් වෙන්නේ නැති ව සමාධිසම්පදාවෙන් පමණක් සෑහීමකට පත් වෙන්නෙත් නැති ව දිබ්බචක්ඛුඤාණය ඇති කර ගන්නවා. නමුත් ඒ භික්ෂුව එයින් නතර වුනොත් ඒ භික්ෂුවටත් ලැබෙන්නේ මේ බුද්ධශාසනය සම්බන්ධයෙන්, බඹසර සම්බන්ධයෙන් එළය පමණයි. අරටුව ලැබෙන්නේ නැහැ. ඕනම ටික නැති වෙලා යනවා.

පින්වතුනි, මේ බුද්ධශාසනය සම්බන්ධයෙන් බොහෝ දෙනෙක් කටයුතු කරන පිළිවෙළ දෙස බලන විට තමාට ඕන කරන අරටුව වැඩිදෙනෙකුට නො ලැබී යන බව පෙනෙනවා. බොහෝ අය මේ බුද්ධශාසනයේ අතුකොළ කපා ගෙන ඒ ටික පොදි බැඳ ගන්නවා. එහෙමත් නැති නම් පොතු ටික හෝ සිවිය හෝ පතුරු ගහලා ඒ ටික එකතු කර ගන්නවා. කලාතුරකින් කෙනෙක් එළය කපා ගෙන රැගෙන යනවා. ඊළඟට ඉතුරු වෙන්නේ කුමක්ද? අරටුව! භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළා, මේ අරටුව ගන්නා කෙනෙකුත් බුදුසසුනෙහි සිටින බව.

යම් භික්ෂුවක් ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසා ආදියෙනුත් සතුටු වෙන්නේ නැහැ. ශීල සංවරයෙන් සෑහීමකට පත් වෙන්නෙත් නැහැ. සමාධිසම්පදාවෙන් සෑහීමකට පත් වෙන්නෙත් නැහැ. දිවැස්නුවණින් සෑහීමකට පත් වෙන්නෙත් නැහැ. ඒ භික්ෂූන් වහන්සේ පිරිසිදු ව ශීලය ආරක්ෂා කර ගෙන චිත්ත-සමාධියත් ඇති කර ගෙන විදර්ශනා භාවනාවත් හොඳට දියුණු කර ගෙන සතර සතිපට්ඨාන, සතර ඍද්ධිපාද, සතර සම්මප්පධාන, පඤ්ච-ඉන්ද්‍රිය, පඤ්ච-බල, සප්ත-බෝධ්‍යාඞ්ග, ආර්ය-අෂ්ටාංගික මාර්ගය යන මේ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම

පිළිවෙළින්-පිළිවෙළින්, පියවරක්-පියවරක් පාසා සම්පූර්ණ කර ගෙන ගිහිල්ලා සියලු බුදු, පසේබුදු මහරහතන් වහන්සේලා අවබෝධ කළා වූ දුක්ඛසත්‍යය, සමුදයසත්‍යය, නිරෝධසත්‍යය, මාර්ගසත්‍යය කියන මේ චතුරාර්යසත්‍ය ධර්මය අවබෝධ කර ගෙන සියලු බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා තමන් තුළ ඇති කර ගත් සෝතාපත්ති මග්ගඤාණය, සකදාගාමී මග්ගඤාණය, අනාගාමී මග්ගඤාණය, අර්හත් මග්ගඤාණය, කියන මේ මාර්ගඥාන හතර භාවිත වශයෙන් වඩලා සම්පූර්ණ කර ගෙන ඒ ඵලයන්ට පත්වෙමින් අනුපාදපරිනිර්වාණය සාක්ෂාත් කර ගන්නවා.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළා, අරටු-ලීයක් අවශ්‍ය මනුෂ්‍යයෙක් කැලේකට ගිහිල්ලා ඒ මනුෂ්‍යයා හොඳට අරටුව තිබෙන ගහක් තෝරා ගෙන ඒ ගහ කපා ගෙන අතුකොළ සියල්ල බැහැර දනවා. එමෙන් ම පොත්ත, සිවිය ආදියත් බැහැර කරනවා. ඵළයත් කපලා ඉවත් කරනවා. ඒ තැනැත්තාට ඒ ඵළයට ඇතුළෙන් පිහිටා තිබෙන අරටුව දැක ගන්න ලැබෙනවා. ඊට පස්සේ අරටු-ලීය කපා ගෙන ඒ මනුෂ්‍යයා සතුටින් යනවා.

මෙය දකින නුවණැති කෙනෙක් ඒ කාරණය ගැන සතුටු වෙනවා. 'මේ තැනැත්තා නම් ඉතා ම ඥානවන්ත කෙනෙක්. නුවණැති කෙනෙක්. මේ තැනැත්තා අතුකොළ-අතුකොළ හැටියට ම හඳුනනවා. ගහේ පොත්ත-පොත්ත හැටියටත් සිවිය-සිවිය හැටියටත් හරයෙන් තොර ඵළය-ඵළය හැටියටත් හඳුනා ගෙන නියම අරටුව නියම සාරය හඳුනා ගත්තා. දැන් මේ තැනැත්තාට ඒ ලබා ගත් අරටුවෙන් නිසි ප්‍රයෝජන ගන්න පුළුවනි' කියලා ඒ පුද්ගලයාගේ ඥානාන්විත බුද්ධිය ගැන සතුටු වෙනවා.

භාග්‍යවතුන් වහන්සේ වදාළා, "යම් භික්ෂූන් වහන්සේනමක් ලාභ - සත්කාර - කීර්ති - ප්‍රශංසාවලින් සතුටු වෙන්නෙත් නැති ව ඒවා බැහැර කරලා ඊළඟට ශීලයෙන් සෑහීමකට පත් වෙන්නෙත් නැති ව ශීලයත් ඉක්මවා යමින් සමාධිසම්පදවත් ඇති කර ගෙන ඒ සමාධියෙනුත් සෑහීමකට පත් නො වී අනතුරු ව ඥානදර්ශනය (දිවැස්නුවණ) ඇති කර ගෙන එයිනුත්

සෑහීමකට පත් නො වී සමථ විදර්ශනා වඩමින් සත්තිස් බෝධිපාක්ෂික ධර්ම මුදුන් පමුණුවා ගෙන උතුම් වූ අනුපාදපරිනිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගන්නවා. ඒ භික්ෂූන් වහන්සේ තමයි, මේ බුද්ධශාසනයෙහි මේ ශීල-සමාධි-ප්‍රඥා-සංඛ්‍යාත ශාසන බ්‍රහ්මචරියාවෙහි අර්ථය නැති නම් අරටුව, සැබෑ සාරය හඳුනාගත්තේ" කියලා භාග්‍යවතුන් වහන්සේ වදාළා. මෙම දේශනාව සමාප්ත කරමින් පැහැදිලි කළා "**ඉතිහිදං භික්ඛවේ නයිදං බ්‍රහ්මචරියං ලාභසක්කාරසිලෝකානිසංසං**" මහණෙනි, මේ බඹසර ලාභ-සත්කාර සඳහා නො වෙයි. එසේ ම "**න සීල සම්පදානිසංසං**" ශීලය ඇති කර ගෙන එයින් සතුටු වෙලා එයින් කෙළවර වෙන්නත් නො වෙයි, මේ බඹසර පවතින්නේ. එමෙන් ම "**න සමාධිසම්පදානිසංසං**" සමාධිය ඇති කර ගෙන එයින් සතුටු වෙලා එයින් ම අවසන් කරන්න නො වෙයි, මේ ශාසන බ්‍රහ්මචරියාව - බුදුසසුන තිබෙන්නේ. එහෙමත් නැති නම් දිවැස් නුවණ ඇති කර ගෙන එයින් ම සෑහීමකට පත් වෙලා එයින් සතුටු වෙලා එතැනින් නතර වෙන්නත් නො වෙයි, මේ බුදුසසුන තිබෙන්නේ. මේ බඹසර තිබෙන්නේ කුමක් සඳහා ද? "**යාච බෝ භික්ඛවේ අකුප්පා චේතෝවිමුත්ති**" - "යම් අකෝප්‍ය වූ චිත්තවිමුක්තියක් - අර්හත් ඵල විමුක්තියක් ඇත්තේ ද අන්න ඒ අර්හත් ඵල විමුක්තිය සාක්ෂාත් කර ගනු සඳහා තමයි, මේ බ්‍රහ්මචරියාව නැති නම් බුද්ධශාසනයේ ශීල - සමාධි - ප්‍රඥා -සංඛ්‍යාත මාර්ගය තිබෙන්නේ" කියලා. භාග්‍යවතුන් වහන්සේ මෙම දේශනාව සමාප්ත කරමින් වදාළා, "**ඒතං සාරං ඒතං පරියෝසානං**" මේ බුදුසසුනෙහි සාරය වන්නේ අවසානය නිෂ්ඨාව වන්නේ ඒ උතුම් වූ නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගැනීම යි.

ඒ නිසා අප මේ සිද්ධ කරන සෑම කුසලයක් ම ඒ නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගැනීම පරමාර්ථ කර ගෙන එය ම සාරය කර ගෙන එය ම ඉලක්කය කර ගෙන එය ම පරමාර්ථය කර ගෙන සිද්ධ කරන්නට ඕනේ. ඒ කියන්නේ දිනපතා මේ පින්වතුන් පන්සිල් සමාදන් වෙනවා නේ ද? ඒ පන්සිල් සමාදන් වෙන්න ඉස්සෙල්ලා නමස්කාර පාඨය කියන්න දෑත් ඔසවන කොට ම සිහි කර ගන්නට ඕනේ 'මම දැන් මේ නමස්කාර

පාඨය කියලා බුදුරජාණන් වහන්සේට නමස්කාර කරන්නේ අනෙකක් සඳහා නො වෙයි, නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගනු සඳහා යි' කියලා.

ඊළඟට "බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සඞ්ඝං සරණං ගච්ඡාමි" කියලා තිසරණයෙහි පිහිටනවා නේ. ඒ තිසරණයෙහි පිහිටන හැම ක්ෂණයක් ක්ෂණයක් පාසා ම සිහි කර ගන්නට ඕනෙ 'මම මේ අයුරින් තිසරණයෙහි පිහිටන්නේ - බුද්ධරත්නය, ධම්මරත්නය, සඞ්ඝරත්නය සරණ යන්නේ, අනෙකක් සඳහා නො වෙයි, නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගැනීම සඳහා ම යි' කියලා. ඊළඟට පඤ්චශීලය සමාදන් වෙනවා නේ. පන්සිල් සමාදන් වෙන කොට "පාණාතිපාතා වේරමණී, අදින්නාදනා වේරමණී..." ආදි වශයෙන් ශික්ෂාපදයක් සමාදන් වෙන, සමාදන් වෙන වාරයක් පාසා ම, 'මේ ශීලයෙහි මම පිහිටන්නේ අනෙකක් සඳහා නො වෙයි, මේ ශීල සංවරය ඇති කර ගෙන නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගැනීම සඳහා යි' කියන අධිෂ්ඨානය තබා ගන්නට ඕනෙ.

ඊළඟට මේ පින්වතුන් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට පූජා කරන්නට මල් නෙළනවා නේ. මල් නෙළලා ඒවා බොහෝ ම ලස්සනට වට්ටිවල අහුරනවා. ඒ මොහොතෙහිත් මලක් නෙළන වාරයක් පාසා ම සිහි කරන්නට ඕනෙ, 'මම මේ මල් නෙළන්නේ අනෙකක් සඳහා නො වෙයි, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට වන්දනාමාන කරලා ඒ ලැබෙන කුසලයත් උතුම් නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගන්නට පාදක කර ගැනීම සඳහා යි', කියලා.

ඊළඟට දැන් මේ පින්වතුන් බණ අහනවා. බණ අහන්න වාඩිවෙන කොට ම හිතන්න ඕනෙ 'අද මේ ධර්මදේශනාව ශ්‍රවණය කිරීමෙන් ලැබෙන කුසලය මාහට නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගන්නට හේතු වේවා' කියලා. ඒ ප්‍රාර්ථනාවෙන් ම ධර්මය ශ්‍රවණය කරන්නට ඕනෙ. එමෙන් ම දුගීමගී-යාචකයෙක් තමන්ගේ ගෙදර දොරකඩට ඇවිල්ලා කීයක් හරි ඉල්ලා සිටි විට 'අනේ මේ කරදරකාර මනුෂ්‍යයෙක් ඇවිල්ලා. අපට කරදරයි. මේ අය හොරු ද දන්නෙත් නැහැ' කියලා එහෙම හිතන්න එපා. හිතන්න ඕනේ 'මේ තැනැත්තාත් මට නිවන් දෙර ඇරලා

දෙන කෙනෙක්. මේ තැනැත්තා යමක් ඉල්ලන නිසා මට යමක් දෙන්නට අවස්ථාව ලැබෙනවා. ඒ නිසා මේ දෙන දනයත් මට නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගන්නට ම හේතු වේවා' කියලා හිතා ගෙන ඒ උපකාරය කරන්න ඕනෙ. කාට හෝ සුළු උපකාරයක් වචනයකින් හෝ සිද්ධ කළොත් ඒ ගැන හිතලා සතුටු වෙන්න, 'මම මේ උපකාරය සිද්ධ කළේ නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගන්නට යි' කියලා.

පින්වතුනි අප විසින් සිද්ධ කරන සෑම සුළු කුසලයක් ම ඒ අයුරින් අපට නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගන්නට ම හරවා ගන්න පුළුවනි. බලන්න, දන් මේ පින්වතුන්ලා ඉතා ම කැපවීමකින් කඨින පූජෝත්සවය සඳහා සූදනම් වෙනවා. පුරාණ කාලයෙහි පින්කම් සිදු කරන කොට මීටත් වඩා බොහෝ ම කළඑලියෙන් ඒවා සිද්ධ කරලා තිබෙනවා.

අනාථපිණ්ඩික මහසිටුතුමා ජේතවනාරාම විහාර පූජෝත්සවය සඳහා කොපමණ මුදලක් වැය කළා ද? දහඅටකෝටියක්! දවස් හතට විහාර පූජෝත්සවය සඳහා දහඅටකෝටියක් වියදම් කළා. ඒ අනුව අපට හිතාගන්න පුළුවනි, දහඅට කෝටියක් වියදම් කරලා සිද්ධ කළා වූ ඒ විහාර පූජෝත්සවය කොපමණ අලංකාරයෙන් තිබෙන්නට ඇති ද? කියලා. සමහර විට මුළු සැවැත් නුවර ම ධජ පතාක දලා සරසවන්න ඇති. සෑම තැන ම මල් වැල් එල්ලලා තිබෙන්න ඇති. ඒ කාලේ විදුලි බුබුළු නැහැ නේ. ඒ නිසා රාත්‍රියට පන්දම් දල්වලා දිවා රාත්‍රී දෙකේ ම මල් පූජා ආදිය සිදු කරන්න ඇති. දවස් හතක් තිස්සේ මහදන් දීලා ජේතවන මහාවිහාරය බුද්ධප්‍රමුඛ මහාසඞ්ඝරත්නය උදෙසා පූජා කළා.

විශාඛා මහෝපාසිකාවත් එබඳු ම අලංකාර මහාපූජාවක් සිද්ධ කළා. පූර්වාරාම විහාරය සාදවලා එය පූජා කිරීම සඳහා නවකෝටියක මහාධනයක් වැය කරලා විහාර පූජෝත්සවයක් සිද්ධ කළා. ඒ අනාථපිණ්ඩික සිටුතුමාත් විශාඛා මහෝපාසිකාවත් ඒ සියල්ල ම සිද්ධ කළේ බුද්ධාලම්බන ප්‍රීතියෙන්, ධම්මාලම්බන ප්‍රීතියෙන්, සඞ්ඝාලම්බන ප්‍රීතියෙන්, බුදුගුණ සිහි කරමින්, දහම්ගුණ සිහි කරමින්, සඟගුණ සිහි කරමින් ධර්මානුකූල ව යි.

එමෙන් ම සමථ, විදර්ශනා චිත්තයන්ට චිත්තාලංකාරයක් වනු පිණිස තමයි, ඒ සියලු ම පින්කම් සිද්ධ කළේ. එසේ සිදු කරන විට ඒ පින්කම් තරඟකාරී පින්කම් වෙන්නේ නැහැ. 'මම මෙච්චරක් වියදම් කළා. මම දැන් අන්න අර තැනැත්තාට වඩා ඉහළින් කරන්න ඕනේ' ආදි වශයෙන් කියලා හිතන්නේ නැහැ. බුදුගුණ, දහම්ගුණ, සඟගුණ ආදිය සිහි කරමින් කරන ඒ පින්කම් සියල්ල ම සමථ, විදර්ශනා භාවනාවන්ට අත්වැලක් වෙමින් නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගන්නට ම ඒකාන්තයෙන් උපනිශ්‍රය වෙනවා. ඒ විශාඛා මහෝපාසිකාවටත් අනාථපිණ්ඩික මහසිටුතුමාටත් ඉදිරියට තමන්ට ලබන්න තිබෙන සෙසු මාර්ග, ඵල පහසුවෙන් සුව සේ ම ලබා ගැනීම සඳහා ඒ මහාපින්කම් ඒකාන්තයෙන් ම හේතු වෙන්නට ඇති.

ඒ නිසා මේ පින්වතුන් කල්පනා කරන්නට ඕනේ, අධිෂ්ඨාන පිහිටුවා ගන්නට ඕනෙ, තමන් ධනය වියදම් කරලා දුයකත්වය දරා ගෙන සිද්ධ කර ගන්නා වූ 'මේ සෑම පින්කමක් ම සියලු බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළ ශාන්ත, සුඛ ලක්ෂණ අජරාමර සංඛ්‍යාත උතුම් නිර්වාණ ශාන්තිය සාක්ෂාත් කර ගන්නට ඒකාන්තයෙන් ම හේතු වාසනා වේවා' කියන ප්‍රාර්ථනාවෙන් යුතු ව ම සිද්ධ කර ගන්නට. ඒ අනුව මේ පින්වතුන් මෙතෙක් වේලා මහාසාරෝපම සූත්‍රදේශනාව මුල් කර ගෙන තමන්ගේ ජීවිතයට අදාළ වන, වැදගත් වන බොහෝ ධර්ම කරුණු ඒ බුද්ධවචනය අනුසාරයෙන් අහලා දරා ගත්තා. මතක තබා ගත්තා.

පින්වතුනි, අසා දරා ගත් ධර්මය පිළිපැදීමෙහි යෙදීම තමයි, වඩාත් ආනිසංසදායක වන්නේ. "**සුනාථ ධාරෙථ චරාථ ධම්මේ**" කියන එකයි, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ බුද්ධවචනය. ඒ නිසා මේ පින්වතුන් බුදුරජාණන් වහන්සේගේ බුද්ධාවවාදයන් සිහි කර ගෙන ශීලයෙහි පිහිටා සමථ, විදර්ශනා භාවනා වඩමින් සතර සතිපට්ඨාන, සතර ඍද්ධිපාද, සතර සම්මප්පධාන, පඤ්ච-ඉන්ද්‍රිය, පඤ්ච බල, සප්ත බෝධ්‍යාඞ්ග, ආර්ය-අෂ්ටාංගික මාර්ගය කියන මේ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වහ වහා වඩා වර්ධනය කර ගන්නට අධිෂ්ඨාන තබා

ගන්න. මෙතෙක් වේලා ධර්මශ්‍රවණය කිරීමෙන් ජනිත කර ගත්තා වූ සියලු පුණ්‍යධර්මයන් සුව සේ ම සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් වඩා වර්ධනය කර ගෙන නො පමා ව දුක්ඛ - සමුදය - නිරෝධ - මාර්ග කියන චතුරාර්යසත්‍ය ධර්මය අවබෝධ කර ගෙන සියලු බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළ ශාන්ත, සුඛ ලක්‍ෂණ අජරාමර සංඛ්‍යාත නිර්වාණ ශාන්තිය සාක්‍ෂාත් කර ගන්නට ම හේතු වාසනා වේවා කියා ප්‍රාර්ථනා කර ගන්න.

මෙතෙක් වේලා සාවධාන ව ධර්මශ්‍රවණය කිරීම් වශයෙන් පහළ වූ කුසල චිත්ත, චෛතසික ධර්ම ඒ ඒ මොහොතේ ම ඇති ව නැති ව ගිය නිසා අනිත්‍ය යි. අනිත්‍ය වූ කුසල චිත්ත චෛතසික සමුදය නිරන්තරයෙන් ම ඇති වීම්, නැති වීම් වශයෙන් සන්තානය පෙළන බැවින් දුක්ඛ යි. අනිත්‍ය වූ දුක්ඛ වූ චිත්ත, චෛතසික සමුදය තමන්ගේ වසඟයෙහි නො පවත්නා බැවින් අනාත්ම යි. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ මේ චිත්ත, චෛතසික, රූප සියල්ල දුක්ඛ-ආර්යසත්‍යය යි. ඒ දුක්ඛ-ආර්යසත්‍යය හටගන්වන පූර්ව භවතෘෂ්ණාව දුක්ඛසමුදය-ආර්යසත්‍යය යි. ඒ දුක්ඛ හා සමුදය දෙකෙහි නො පැවැත්ම දුක්ඛනිරෝධ-ආර්යසත්‍යය යි. ඒ දුක්ඛනිරෝධය සාක්‍ෂාත් කරන මාර්ගය, ප්‍රතිපදාව දුක්ඛනිරෝධගාමිනී පටිපදා-ආර්යසත්‍යය යි. ඒ උතුම් වූ චතුරාර්යසත්‍ය ධර්මය අවබෝධ කර ගැනීම සඳහා ම මේ පින්කම් මාලාවේ සියලු කුසල ධර්ම ඒකාන්තයෙන් ම හේතු වාසනා වේවා කියා නැවතත් ප්‍රාර්ථනා කර ගන්න.

සිද්ධ කරගත්තා වූ මේ පුණ්‍යසම්පත්තිය ඉන්ද්‍රෝපේන්ද්‍රාදි සම්‍යක්දෘෂ්ටික දිව්‍යරාජ සමූහයා විසින් අනුමෝදන් වනු ලබත්වා! පින් අනුමෝදන් වන්නා වූ දෙවිවරු උතුම් නිවනින් සැනසෙත්වා! යන අදහසින් පින් පමුණුවමු.

**ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවානාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සාසනං**
**ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවානාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු දේසනං**
**ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවානාගා මහිද්ධිකා**

**පුඤ්ඤං තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු මං පරං**

නමින් ජන්මාන්තර ගත වූ දෙමවුපිය - ඥාති - හිතමිත්‍රාදි සැම සියලු දෙනාටමත් මේ පින් පෙත්අත්පත් වීමෙන් ඥාතීන් ද සුඛී සුවපත්භාවයට පත් වෙත්වා! සංසාර දුකින් අත්මිදී උතුම් නිවනින් සැනසෙත්වා! යන අදහසින් පින් පමුණුවමු.

**ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ**
**ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ**
**ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ**

සිදු කර ගත්තා වූ මේ සියලු පුණ්‍යධර්මයන්ගේ බලයෙන් ද රත්නත්‍රයේ සූවිසි මහාගුණ බලයෙන් ද මේ පින්වත් සැමදෙනාට ම තව තවත් දන, ශීල, භාවනා ආදි උදර පුණ්‍යධර්මයන් සිද්ධ කර ගන්නට කායික මානසික නිදුක් නිරෝගි සුවය-ශක්තිය සැලසේවා! කාය-චිත්ත පීඩා දුරු වෙලා කායික මානසික සැනසීම සැලසේවා! සිත්සතන් පිනට, දහමට, කුසලයට ම නැඹුරු වීමෙන් මෙලොව ජීවිතත් සුවපත් වී පරලොව ජීවිතත් සුවපත් වී සංසාර දුකින් අත්මිදී උතුම් නිවනින් සැනසීම සඳහා ම මේ පුණ්‍යධර්මයන් හේතු වාසනා වේවා කියා ප්‍රාර්ථනා කරන්න.

සාධු **!** සාධු **!!** සාධු **!!!**

## සබ්බදානං ධම්මදානං ජිනාති ...
## (සියලු දානයන් අතරින් ධර්මදානය උතුම් වේ.)

මහාකම්මට්ඨානාචාර්ය අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සහ තවත් දේශකයන් වහන්සේලාගේ පටිගත කරන ලද ධර්මදේශනා **MP3 CD** තැටි (ධර්මදානයක් වශයෙන්) දැන් ඔබටත් **ශ්‍රී සද්ධර්ම සංසදය** වෙතින් ලබා ගත හැකි ය.

| අංකය | Video CDs |
|---|---|
| VC-001 | නා උයන අරණ්‍ය සේනාසන චාරිකාව හා ධර්මසාකච්ඡාව |
| VC-002 | තිරිසන් අපායේ දුක |
| | |
| | **MP3 CDs** |
| MC-001 | 'සදහම් සයුර' ධර්මදේශනා කාණ්ඩ අංක 01 |
| MC-002 | 'සදහම් සයුර' ධර්මදේශනා කාණ්ඩ අංක 02 |
| MC-003 | 'සදහම් සයුර' ධර්මදේශනා කාණ්ඩ අංක 03 |
| MC-004 | 'සදහම් සයුර' ධර්මදේශනා කාණ්ඩ අංක 04 |

ශ්‍රී සද්ධර්ම සංසදය මගින් ධර්මදානය පිණිස නොමිලයේ ලබාදෙන මෙම ධර්මදේශනා **CD** තැටි ලබා ගැනීම සඳහා ඔබගේ **නම, ලිපිනය, දුරකථන අංකය, විද්‍යුත් තැපැල** (E-mail) සහ **අවශ්‍ය CD තැටියේ අංකය** ආදි විස්තර, රු. 30/= තැපැල් මුද්දර සහිත ව පහත ලිපිනයට යොමු කරන්න.

**ධර්මදේශනා CD තැටි**
**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය,**
**රයියාදෙළුව,**
**උග්ගල්බොඩ,**
**ගම්පහ.**

- එක්වරකට ඉල්ලුම් කළ හැක්කේ එක් **CD** තැටියක් පමණක් බව කරුණාවෙන් සලකන්න. මෙම සියලු ම ධර්මදේශනා ධර්මදානය පිණිස නොමිලයේ ලබා දෙන අතර කිසි ම දේශනාවක් හෝ ප්‍රකාශනයක් පිටපත් කර **(copy)** විකිණීම සපුරා තහනම් වේ. ධර්මදානය පිණිස නොමිලයේ බෙදාහැරීමට අවසර ඇත.
- එසේ ම ඔබ විසින් ඉල්ලුම් කරන ලද **CD** තැටිය මාසයක් ඇතුළත ඔබට නො ලැබුණි නම් කරුණාකර E-mail හෝ දුරකථනය මගින් විමසන්න.
- පින්වත් ඔබට ද මෙම **CD** තැටි ධර්මදානය සඳහා දායක විය හැකි ය. වැඩි විස්තර සඳහා විමසන්න. **Tel: 071-4417813**

තෙරුවන් සරණයි!

පුණ්‍ය ශ්‍රී තුෂන්ත
ශ්‍රී සද්ධර්ම සංසදය

<u>විමසීම්</u>
Tel: 071-4417813
Web: www.sadaham.net
E-mail: info@sadaham.net

ධර්මදානය පිණිස යි.

අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ
ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ
ශ්‍රී සද්ධර්ම සංසදය මගින් ප්‍රකාශිත දහම් පොත්
www.sadaham.net
යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.

ප්‍රකාශනය

ශ්‍රී සද්ධර්ම සංසදය

ධම්මාරාම යෝගාශ්‍රමය

විමසීම් :- 071-4417813

වෙබ් අඩවිය:- www.sadaham.net

පිටු සැකසීම හා මුද්‍රණය

e-Artefacts Technologies

305/5, Hansagiri Road, Gampaha

Tel:- 077-3021777, 071-4417813

Web:- www.eartefacts.com